# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,560 - 2008 ජූලි මස 25 වැනි සිකුරාදා - 2008.07.25**

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස : (IIඅ) වැනි ඡෙදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| තනතුරු - ඇබෑර්තු ... ... ... ... | 850 | විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | 856 |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයෙහි* සෑම කොටසකටම අග පිටුවෙහි සෑම මාසයකම මුල් සතියේ දී පළ කරනු ලබන *ගැසට්* නිවේදන බාර ගන්නා අවසාන දිනය සහ වේලාව සඳහන් නිවේදනය කෙරෙහි ඔබගේ අවධානය මින් යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* සෑම කොටසකම පළකළ යුතු *ගැසට්* නිවේදන භාර ගන්නා වේලාව, *ගැසට් පත්‍රය* ප්‍රසිද්ධ කරනු ලබන සිකුරාදා දිනට සති දෙකකට පෙර එළඹෙන සිකුරාදා දිනයෙහි දහවල් 12 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, ටෙන්ඩර් දැන්වීම්, වෙන්දේසි පිළිබඳ දැන්වීම් යනාදියෙහි සඳහන් කරනු ලබන අවසාන දිනය සහ වේලාවන් ඊට අනුරූපව - එනම් දැන්වීම්, රජයේ මුද්‍රණාලයට එවන සහ එම දැන්වීම්, පළ කරන දින අතර සෑහෙන කාල වේලාවක් දෙමින් එම දැන්වීම්වල සඳහන් කරුණු කෙරෙහි *උනන්දුවක්* දක්වන සෑම කෙනෙකුටම ප්‍රයෝජනවත් වන පරිදි ඊට සහභාගිවීමට ඉඩ ප්‍රස්ථාවක් සැළසෙන සේ සකස් කරන මෙන් සියලුම දෙපාර්තමේන්තු, සංස්ථා, මණ්ඩල යනාදියෙන් මින් ඉල්ලා සිටිනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම පිණිස එවන සෑම දැන්වීමක්ම *ගැසට් පත්‍රය* ප්‍රසිද්ධ කරනු ලබන දිනට සති දෙකකට පෙර - එනම් 2008 අගෝස්තු මස 01 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයට* යා යුතු දැන්වීම් 2008 ජූලි මස 18 වැනි දින දහවල් 12.00 ට හෝ ඊට පෙර රජයේ මුද්‍රණාලයට ලැබෙන සේ එවිය යුතුය.

**ලක්ෂමන් ගුණවර්ධන,**
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

2008 ජනවාරි මස 01 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.


847 - B 079924 —9,435 (2008/07)

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන රාජ්‍ය සේවා පත් කිරීම්වලට අදාළ වන පොදු කොන්දේසි

**අවශ්‍ය සාමාන්‍ය සුදුසුකම් :**

1.1 තමා ශ්‍රී ලාංකිකයෙකු බවට ප්‍රමාණවත් සාක්ෂි සෑම අයදුම්කරුවකු විසින්ම ඉදිරිපත් කළ යුතුය.

ශ්‍රී ලාංකික යනුවෙන් අදහස් කෙරෙනුයේ ලංකා පුරවැසි පනතේ අර්ථ දක්වා ඇති පරිදි පාරම්පරික වශයෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසිකම් ලැබූවෙකි.

1.2 ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට වඩා උසස් විභාගයකින් සමත් වී තිබීම අවම අධ්‍යාපනික සුදුසුකමක් වශයෙන් නියම කොට ඇති යම් තනතුරක් සඳහා ඉල්ලුම් කරන අයදුම්කරුවෙකු සිංහල හෝ දෙමළ හෝ මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ අයෙකු වේ නම්, ඔහු ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ සිංහල හෝ දෙමළ හෝ භාෂාව විෂයයෙන් අවස්ථාවෝචිත පරිදි සමත් වී සිටිය යුතුය. (1961 ජනවාරි මස 1 වැනි දිනට පෙර දිනක සිට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින්නාවූත් රාජ්‍ය සේවයෙහි වෙනත් තනතුරුවලට ඉල්ලුම් කරන්නාවූත් නිලධාරින් විෂයෙහි මෙම නියමය අදාළ නොවන්නේය.)

*1.3 අයදුම් කරනු ලබන තනතුර සඳහා නියමිත ඉහළම රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණවලින් නිදහස් කිරීමට හිමිකම් ලබන සුදුසුකම් පසු කලකදී ලබා තිබේ නම් මිස, නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණය සමත්වීමට අපොහොසත්වීම නිසා පරිවාස/පරීක්ෂණ කාලයකට යටත් දෙන ලද සිය පත්වීම අවසන් කරනු ලැබූ, සිංහල හෝ දෙමළ හෝ නොවන භාෂා මාධ්‍යයකින් රජයේ සේවයට ඇතුළත්ව සිටි නව ප්‍රවේශක නිලධාරීන්ගෙන් ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

**2. සේවා කොන්දේසි - සාමාන්‍ය :**

2.1 රාජ්‍ය සේවයෙහි යෙදී සිටින සියලුම නිලධාරීහු මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහය, දෙපාර්තමේන්තු නියෝග හෝ රෙගුලාසි සහ රජය විසින් වරින් වර නිකුත් කරනු ලැබිය හැකි වෙනත් නියෝග හෝ රෙගුලාසිවලට යටත් විය යුත්තා හ.

2.2 අදාළ අමාත්‍යාංශයෙහි ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි ප්‍රමාණයේ මුදලක් එම ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි අන්දමකින් ඇප තබන ලද රාජ්‍ය සේවා නිලධාරින්ගේ (ඇප) ආඥාපනත යටතේ රාජ්‍ය නිලධාරියකුට නියම කරනු ලැබිය හැකිය.

2.3 දිවයිනේ ඕනෑම තැනක සේවය කිරීමට රාජ්‍ය නිලධාරියෙකුට නියම කරනු ලැබිය හැකිය.

**3. ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරින්ට අදාළ සේවා කොන්දේසි :**

3.1 ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරිහු පූර්වෝක්ත 2 වන වගන්තියේ සඳහන් කොන්දේසිවලට අතිරේක වශයෙන් පහත දක්වෙන අතිකුත් කොන්දේසිවලටද යටත් විය යුතුය.

3.1.1 යම්කිසි තනතුරක පරිවාස කාලය අවුරුදු තුනකට වැඩි විය යුතු යැයි සලකනු ලබන්නේ නම් විනා එසේ නොමැති නම් සියලුම පත් කිරීම් අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වනු ඇත. පරිවාස කාලය තුළ හේතුවක් නොදක්වා සේවය නතර කරනු ලැබිය හැකිය.

3.1.2 සියලුම රාජ්‍ය නිලධාරිහූ රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියෙහි අවශ්‍යතාවයන් සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ IV වන පරිච්ඡේදයේ විධිවිධාන සහ රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනට පවත්නා වූ සහ මින් මතු පනවනු ලබන්නාවූ අනෙකුත් නීති, රෙගුලාසි සහ ව්‍යවස්ථා ද පිළිපැදිය යුත්තාහ.

3.1.3 රාජ්‍ය භාෂාවකින් වැඩ කිරීමට හැකිවන අන්දමේ දැනුමක් තමන්ගේ පරිවාස කාලය ඇතුළත ලබාගන්නා ලෙස සිංහල හෝ දෙමළ නොවන භාෂා මාධ්‍යයකින් රාජ්‍ය සේවයට ඇතුළත් වූ නිලධාරින්ට නියම කෙරේ.

3.1.4 සිංහල හෝ දෙමළ හෝ නොවන වෙනත් භාෂා මාධ්‍යයකින් සේවයට ඇතුළත් වූ නිලධාරියෙකු පරිවාස කාලය අවසානයේදී තනතුරෙහි ස්ථිර කරනු ලැබීමට අදාළ වන වෙනත් කරුණු අතර, අවුරුද්දක් ඇතුළත කවර හෝ රාජ්‍ය භාෂාවකින් නියමිත ප්‍රවීනතා පරීක්ෂණයෙහි I වැනි ශ්‍රේණියෙන් සමත්වීමත්, අවුරුදු දෙකක් ඇතුළත II වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් (අවශ්‍යනම්) අවුරුදු තුනක් ඇතුළත III වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් බලපවත්වනු ඇත.

නියමිත කාල සීමා ඇතුළත දී පරීක්ෂණයකින් අසමත් වුවහොත් වැටුප් වර්ධකයක් තාවකාලිකව අත්හිටුවනු ලැබිය හැකිය. නියමිත කාලසීමාව ඉක්මවා තව මාස හයක කාල සීමාවක් ඇතුළත යථෝක්ත පරීක්ෂණයෙන් සමත්වීමට අසමත් වුවහොත් එසේ වැටුප් වර්ධක තාවකාලිකව අත්හිටුවීම, වැටුප් වර්ධක නතර කිරීමකට පරිවර්තනය කෙරෙනු ඇත. පරීක්ෂණයෙන් සමත්වන තෙක් හෝ පහත දක්වෙන 3.1.6 වැනි වගන්තියේ විධිවිධානයන් බලපවත්වන තෙක් හෝ යථෝක්ත වැටුප් වර්ධකයන් නතර කිරීම ක්‍රියාත්මක වන්නේය.

3.1.5 මෙවැනි නිලධාරින්ට පත්වීම ලැබීමෙන් පසු රාජ්‍ය භාෂාවක ප්‍රවීණතාවය ලබා ගැනීම පිණිස මාස හයක කාලයක් සඳහා පූර්ණ වැටුප් සහිත පහසුකම් සැළසිය යුතුය. ඉන් අනතුරුව අදාළ ප්‍රවීණතා විභාගයට ඔහු පෙනී සිටිය යුතු අතර, එම විභාගයෙන් අසමත් වුවහොත් පූර්ණ වැටුප් සහිත මාස හයක කාල පරිච්ඡේදයෙන් පසු ඒ සමගම එළඹෙන අවුරුදු දෙකක කාල පරිච්ඡේදය තුළ තමාගේ සාමාන්‍ය රාජකාරිවල නිරත වෙමින් සිටිය දී විභාගයෙන් සමත්වීමට ඔහුට අවස්ථාව සලසා දෙනු ලැබේ.

3.1.6 නියමිත අවුරුදු දෙකහමාරක කාල පරිච්ඡේදය තුළ විභාගයෙන් සමත්විමට නොහැකි වුවහොත් ඔහුගේ සේවය අවසන් කරනු ලැබේ.

3.1.7 රාජ්‍ය සේවයෙහි ස්ථිර තනතුරක දැනටමත් ස්ථිර කරනු ලැබ සිටින රාජ්‍ය නිලධාරියෙකු රාජ්‍ය සේවයෙහි වෙනත් ස්ථිර තනතුරකට පත් කරනු ලැබූ විට යළි පරිවාස කාලසීමාවක් සේවය කරන ලෙස සාමාන්‍යයෙන් ඔහුට නියම කරනු නොලැබේ. එවැනි නිලධාරියෙකු සිය නව තනතුරෙහි කරන සේවය පරීක්ෂා කර බැලීම සඳහා ප්‍රථමයෙන් එම තනතුරෙහි නියමිත කාල සීමාවක් වැඩ බැලීම සඳහා ඔහු පත් කරනු ලැබිය හැකිය.

3.1.8 (රාජ්‍ය සේවයෙහි දැනටමත් ස්ථිර/තාවකාලික තනතුරු දරන්නාවූද වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ලැබුවා වූ ද, අය හැර) තෝරාගනු ලැබූ අපේක්ෂකයන් දිවයිනේ ඕනෑම පෙදෙසක සේවය කිරීමට ශාරීරිකව සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට ඉදිරිපත්වන ලෙස ඔවුනට නියම කරනු ඇත.

**4. සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි :**

4.1 ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට පත් කරනු ලබන රාජ්‍ය නිලධාරින් විසින් ඔවුන්ගේ වැටුපෙන් අයකර ගතයුතු යයි ආණ්ඩුව විසින් නියම කරනු ලබන ප්‍රතිශතක ප්‍රමාණයට සමාන මුදලක් ස්වකීය වැටුපෙන් වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් වශයෙන් ගෙවිය යුතුය.

4.2 අර්ථසාධක අරමුදල් පදනම මත ස්ථිර හෝ තාවකාලික තනතුරුවලට පත්කරනු ලැබූ රාජ්‍ය නිලධාරින් ස්වකීය ඒකාබද්ධ වැටුපෙන් 6%ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවිය යුතු වන්නේය. මුදල් වර්ෂය අවසානයේදී අනිවාර්ය දායක මුදල් වශයෙන් අරමුදලට බැරකර ඇති මුදල් ප්‍රමාණය මෙන් 150%ක මුදල් ප්‍රමාණයක් රජය විසින් එම අරමුදලට රජයේ දායක මුදල වශයෙන් ගෙවනු ඇත.

4.3 පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලබන රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු උසුලන්නාවූ නිලධාරින් සහ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබ පළාත් පාලන සේවයේ (විශ්‍රාම වැටුප් සහිත) තනතුරු උසුලන්නාවූ නිලධාරින් හට පිළිවෙලින් ඔවුන්ගේ පළාත් පාලන සේවයේ සහ රාජ්‍ය සේවයේ තනතුරු සහ විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ.

4.4 විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදලා හරිණු ලැබූ යුද්, නාවික සහ ගුවන් හමුදාවේ නිත්‍ය සේවයෙහි නියුතු පිරිසට ඔවුන්ගේ රාජ්‍ය සේවයෙහි තනතුරු සඳහා විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ. මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප් සහිත බවට ප්‍රකාශිත තනතුරක රාජ්‍ය නිලධාරියෙක් ලෙස පත්වීමක් භාර ගැනීම සඳහා මුදා හරිණු ලැබූ සන්නද්ධ හමුදාව යම් සාමාජිකයෙකුගේ සම්පූර්ණ වැටුප් සහිත අහිමි නොවූ සේවා කාල සීමාව මේ ව්‍යවස්ථා සංග්‍රහයේ පටහැනිව කුමක් සඳහන්ව ඇත්ද, මේ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ගෙවිය යුතු යම් විශ්‍රාම වැටුප් පාරිතෝෂිකයක කාර්යය සඳහා ගණන් ගත යුතුය.

**5. යුද්ධ සේවා අනුග්‍රහය :**

5.1 එක්සත් රාජ්‍ය යුද්ධාවතීරණ හමුදාවන්හි සේව මුක්ත හටයින් ද, සහය ගිනි නිවන, ගගන ප්‍රහාර නිවාරණ සහ මහජන ආරක්ෂක සේවාවන්හි පූර්ණකාලීන සාමාජිකයන් වශයෙන් නියුක්තව සිටි තමන්ගේම ඕනෑකමින් එම සේවාවන්ගෙන් අස්ව නොගිය අයටද ඉහත කී සියලු සුදුසුකම් තිබේ නම් ද ඔවුන් මෙම හමුදාවන්ට බැඳී ඇත්තේ 1954 අගෝස්තු මස 15 වැනි දිනට පෙරාතුව නම්ද, ඔවුන්ගේ එස සේවාවන් සතුටුදායක ලෙස සහ අඛණ්ඩව පැවතිණි නම්ද, වයස අතින් සුදුසුකම් ලබා ගැනීම සඳහා ඔවුන්ට තමන්ගේ වයස්වලින් 1939 සැප්තැම්බර් මස 3 වැනි දින සිට 1949 දෙසැම්බර් මස 31 වැනිදා දක්වා වූ කාල සීමාව තුළ තම තමන් සේවය කළ කාලයන් අඩුකර ගැනීමට ඉඩදෙනු ලැබේ.

**6. රාජ්‍ය සේවයෙහි දැනට සේවය කරන නිලධාරිහු :**

6.1 රාජ්‍ය සේවයෙහි දැනට සේවයෙහි යෙදී සිටින්නාවූත්, අවශ්‍ය සියලු සුදුසුකම් ඇත්තාවූත්, නිලධාරින් විසින් ඉදිරිපත් කරන අයදුම්පත් ඔවුන්ගේ, දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් එවිය යුතුය. නව තනතුරු සඳහා ඉල්ලුම් කරන්නා වූ ද, රාජ්‍ය සේවයෙහි දැනට ස්ථිර තනතුරු දරන්නාවූ ද, නිලධාරින්ගෙන් යමෙකු නව තනතුරකට තෝරාගනු ලැබුවහොත් ඒ සඳහා ඔවුන් මුදවාලිය හැකි ද නොහැකිද යන්න එම නිලධාරින් සේවයෙහි යෙදී සිටින දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් විසින් ඔවුන්ගේ අයදුම්පත් ඉදිරිපත් කරන විට සඳහන් කළ යුතුය.

6.2 නියමිත වේලාවක නියමිත ස්ථානයක දී සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙනී සිටින ලෙස අයදුම්කරුවන්ට නියම කරනු ලැබිය හැක. මේ සම්බන්ධයෙන් දැරීමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් වියදම් ආදියත් ගෙවනු නොලැබේ.

6.3 යම්කිසි අයදුම්කරුවකු නිර්දේශ කිරීමට අදහස් කරන කෙනෙකු විසින් අයදුම්කරුට චරිත සහතිකයක් දීමෙන් එසේ කළ යුතුය. යම් අයදුම්කරුවකු තෝරා ගන්නා පරිද්දෙන් කවර අන්දමේ වුවද අයථා අනුග්‍රහයන් පැතීම හෝ එහිලා යම් බලපෑමක් කිරීමට තැත් කිරීම හෝ එම අයදුම්කරු නුසුදුස්සකු කරනු ලැබීමට හේතුවනු ඇත.

6.4 අයදුම්කරුගේ අයදුම්පතෙහි කිසියම් සාවද්‍ය ප්‍රකාශයක් තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කළින් දැනට ගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන් ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත් තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් ඔහු රාජකාරියෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

6.5 මෙම දැන්වීමෙහි සඳහන් වන නියමයන්ට සෑම අතින්ම අනුකූල නොවන අන්දමේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**7. සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප් යන්නෙහි අර්ථ දැක්වීම :**

7.1 සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප යන්නෙන් අදහස් කෙරෙනුයේ ඒකාබද්ධ වැටුප පමණකි. වැඩ බැලීමේ වැටුපක් හෝ දීමනා ආදිය ඊට ඇතුළත් නොවන්නේය.

**8. බඳවා ගැනීම සහ උසස් කිරීම සම්බන්ධ නව ජාතික ප්‍රතිපත්තිය :**

පසුව නිකුත් කෙරෙන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ මගින් සංශෝධනය කිරීමට යටත්ව 1990.08.09 දිනැති අංක 15/90, 1990.03.05 දිනැති අංක 15/90(I) සහ 1990.06.15 දිනැති අංක 15/90 (II) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවල දක්වා ඇති ප්‍රතිපත්තියට අනුකූලව රාජ්‍ය සේවයට, පළාත් රාජ්‍ය සේවයට රාජ්‍ය සංස්ථා අංශයට සහ රජයට සම්පූර්ණයෙන්ම අයත් සමාගම්වලට බඳවා ගැනීම සහ උසස් කිරීම 1990.01.01 දින සිට සිදුකරනු ඇත.

# විභාග අපේක්ෂකයන් සඳහා නීති සහ උපදෙස්

"1968 අංක 25 දරන විභාග පනතේ දක්වා ඇති විධිවිධානයන්ට අනුකූලව කටයුතු කිරීමට සියළුම විභාගාපේක්ෂකයින් බැඳී ඇත"

සියලුම විභාගාපේක්ෂකයින් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතුය. මේ නීති කිසිවක් උල්ලංඝනය කරන විභාගාපේක්ෂකයෙකුට විභාග කොමසාරිස්ට අභිමත පරිදි පහත සඳහන් දඬුවම් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ පමුණුවනු ලැබේ.

i. මුළු විභාගයම හෝ ඉන් කොටසකට හෝ නැතහොත් එක් විෂයයකට හෝ ඉන් කොටසට හෝ පෙනී සිටීම හෝ තහනම් කිරීම.
ii. විභාගයේ එක් විෂයයකට හෝ මුලු විභාගයටම හෝ නුසුදුස්සෙකු කිරීම.
iii. එක් අවුරුදු හෝ අවුරුදු දෙකකට හෝ කිසිම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම.
iv. මුළු ජීවිත කාලයේම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම.
v. සහතික පත්‍රය යම්කිසි කාල සීමාවක් තුළ තහනම් කිරීම.
vi. විභාගාපේක්ෂකයාගේ ක්‍රියා පරිපාටිය සම්බන්ධයෙන් ඔහු ගැන වග කිවයුත්තන්ට සැලකර සිටීම හෝ විභාගාපේක්ෂකයාගේ පොලීසියට භාරදීම හෝ ඔහුගේ ක්‍රියාව සම්බන්ධයෙන් පොලීසියට පැමිණිලි කිරීම.

විභාගයට කලින් හෝ විභාගය පවත්වාගෙන යන අතරතුරු හෝ විභාගයට පසුව හෝ කොයිම අවස්ථාවකදි වුවත් එවැනි විභාගපේක්ෂකයෙකු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ බලය විභාග කොමසාරිස් සතුවේ. ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේය. එහෙත් රජයේ සේවකයන් බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විභාග පිළිබඳව විභාග කොමසාරිස්ගේ තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සමීක්ෂණයට යටතේ වන්නේය.

1. සියළුම විභාගාපේක්ෂකයන් විභාග ශාලාව තුළදීත් ඒ අසළදීත් විභාගශාලාධිපතින්ට ද, ඔහුගේ සහාකාරයින්ට ද, අනිකුත් විභාගාපේක්ෂකයින්ට ද බාධාවක් හෝ අවහිරයක් හෝ ඇති නොවන ලෙස ශාන්තදාන්තව හැසිරිය යුතුය. විභාග ශාලාවට ඇතුළු වන විටත්, ඉන් පිටවන විටත් ඉතා සන්සුන් ලීලාවෙන් හැසිරිය යුතුය.

2. විභාගාපේක්ෂකයෝ විභාගශාලාධිපතීන්ට කීකරු විය යුත්තාහ. එබැවින් ඔවුන් විභාගය පවත්වාගෙන යන අතරතුරත්, විභාගය පටන් ගැනීමට පෙරත්, විභාගය අවසන් වූ විගසත් විභාගශාලාධිපතින්ගේ හා ඔහුගේ සහකාරයන්ගේ උපදෙස් අනුව ක්‍රියා කළ යුතුය.

3. විභාගයේදී ප්‍රශ්න පත්‍රයකට උත්තර ලිවීම පටන්ගෙන පැය භාගයක් ගතවුවාට පසු මොනම කාරණයක් නිසාවත් විභාගාපේක්ෂකයෙකු විභාග ශාලාවට ඇතුලු කරගනු නොලැබේ. විභාගය පටන් ගෙන පැය භාගයක් ගතවන තුරු ප්‍රශ්න පත්‍රයට පෙනී සිටින අපේක්ෂකයෙකුට විභාග ශාලාවෙන් පිටවී යාම තහනම්ය. ප්‍රායෝගික පරීක්ෂණවලට හෝ වාචික පරීක්ෂණවලට පමාවී පැමිණෙන අපේක්ෂකයන් විභාග ශාලාවට ඇතුළු නොකිරීමට ඉඩ තිබේ.

4. සෑම විභාගාපේක්ෂකයෙකුම තමාගේ විභාග අංකය දරන ආසනයේ හැර වෙන කිසිම තැනක වාඩි නොවිය යුතුය. විභාශාලාධිපතිනේ විශේෂ අවසරය නොමැතිව තමන්ගේ ස්ථානය වෙනස් නොකළ යුතුයි. තමන්ට නියම නොකරන ලද අසුනක් ගැනීම වංචනික අදහසින් කරන ලද ක්‍රියාවක් වශයෙන් සලකනු ලැබීමට අවකාශයකි.

5. විභාග ශාලාව තුළ සම්පූර්ණයෙන්ම නිශ්ශබ්දව සිටිය යුතුය. මොනම කාරණයක් නිසාවත් විභාග ශාලාව ඇතුළත දි විභාග ශාලාවේ කාර්ය මණ්ඩලයේ කෙනෙකු සමග හැර, විභාග ශාලාව ඇතුළත හෝ පිටත් හෝ සිටින කිසිවකු සමග මොනයම් කරුණක් නිසාවත් කතාබස් කිරීම හෝ පණිවුඩ හුවමාරු කර ගැනීම හෝ වෙනත් අන්දමේ ගනුදෙනු කිරීම හෝ සම්පූර්ණයෙන්ම තහනම්ය. යම් කිසි හදිසි වුවමනාවක් සඳහා කිසිවෙකු සමග කතාබස් කිරීම් ආදියත් අවශ්‍ය වුවහොත් ප්‍රථමයෙන් ඒ සඳහා විභාගශාලාධිපතින්ගේ අවසරය ලබා ගත යුතුයි.

6. විභාගාපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රය හඳුනාගනු ලබන්නේ ඔහුගේ විභාග අංකයෙන් පමණක් හෙයින් උත්තර පත්‍රවල තමන්ගේ නම නොලිය යුතුයි. තමාගේ උත්තර පත්‍රයෙහි අන්‍ය විභාගාපේක්ෂකයෙකුගේ විභාග අංකය ලිවීම වංචනික ක්‍රියාවක් කිරීමට ප්‍රයන්ත දැරීමක් ලෙස සළකනු ලැබේ. හඳුනාගත නොහැකි පරිදි විභාග අංකය ලියා ඇති උත්තර පත්‍ර ප්‍රතික්ෂේප කිරීමටද සිදුවෙනවා ඇත.

7. තමන් වෙත සපයන ලද කඩදාසි හැර තීන්ත පොවන කඩදාසියෙහි හෝ ප්‍රශ්න පත්‍රයෙහි හෝ මේසය මත හෝ වෙන කිසි තැනක හෝ කිසිවක් නොලිය යුතුය. මේ නීතිය නොසැලකීම වංචනික චේතනාවකින් යුක්තව ක්‍රියා කිරීමකැයි සැළකිය හැකිවේ.

8. තමන් වෙත සපයන ලද කඩදාසියක් හෝ උත්තර ලියන පොතක් හෝ ඉරාදැමීම හෝ පොඩි කිරීම හෝ නමා දැමීම හෝ අකාමකා දැමීම හෝ නොකළ යුතුය. කටුවැඩි ආදිය සඳහා පාවිච්චි කරන ලද සෑම කඩදාසියක්ම උත්තර පත්‍රයට ඇමිණිය යුතුය. ඒවා උත්තර පත්‍රයෙහිම කොටසක් විය යුතුය. (එබඳු කටුවැඩ පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. විභාග ශාලාවේදී ලියන ලද කියන

9. ගණිත ප්‍රශ්නවලදී ගණන් වරදවා සාදා හෝ ගණනක් කොහෙත්ම නොසාදා හෝ නිවැරදි පිළිතුරු දැක්වීමක් චිත්‍ර කර්මයේදී තමන්ගේ චිත්‍රය තවත් අපේක්ෂකයෙකුගේ චිත්‍රයට ආකල්ප මාත්‍රයෙන් හෝ ස්වරූපයෙන් හෝ ක්‍රියාකාරිත්වයෙන් හෝ යනාදියකින් සමානව, එසේ නැතිනම් බොහෝ සෙයින්ම කිට්ටුවම තිබීමත්, වංචා සහගත ක්‍රියාවක් සේ සළකනු ලැබීමට හේතු විය හැකිය.

10. විභාගයේදි උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන කඩදාසි හෝ වෙනත් ද්‍රව්‍ය විභාග ශාලාවෙන් පිටතට ගෙනයාම තහනම්ය. මේ සියලුම දෑ විභාග කොමසාරිස් සතුය. මේ නීතිය කඩකිරීම වංචනික චේතනාවකින් යුත් ක්‍රියාවක් ලෙස සැළකීමට හේතු විය හැකිය.

11. තමන් වෙත සපයන ලද ලිපි ද්‍රව්‍ය හැර වෙනත් පොත්පත්, සටහන් පොත්, සාක්කුවේ පාවිච්චි කරන නෝට් පොත්, ඇක්සයිස් පොත් හා කඩදාසි කොල හො කැබලි ද, තමන්ගේ පාට පෙට්ටි හා පාර්සල් ආදිය ද, පයිල් කවර, කාඩ්බෝඩ් පෑඩ්, නැවු ප්‍රවෘත්ති පත්‍ර, බ්‍රවුන් පේපර් යනාදිය ද, විභාග ශාලාව තුළ සිටින කිසි විටෙක තමා වෙත සමීපයෙහි හෝ තබා නොගත යුතුය. මේ නීතිය කඩ කිරීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවකි.

12. විභාග ශාලාව තුළ කිසිම අපේක්ෂකයෙකු අත කිසිම පොත් පතක් හෝ සටහන් පොතක් හෝ සටහන් ලියන කඩදාසියක් හෝ තබා ගැනීම සම්පූර්ණයෙන්ම තහනම් ය. විභාගශාලාධිපතීන් නියම කළහොත් සෑම අපේක්ෂකයාම තමන් සන්තකව තිබෙන දෑ මේ මේ යයි සහතික කිරීමට බැඳී සිටී. මේ අවශ්‍යතා කඩකිරීම වංචා සහගත ක්‍රියාවක් කිරීමට යත්ත දැරීමක් ලෙස සළකනු ලැබේ.

13. වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයකින් හෝ පොත පතකින් හෝ ප්‍රතයකින් හෝ සටහන් සහිත කොලයකින් හෝ වෙන කිසිවකින් හෝ ගෙන හොර උත්තර ලිවීම හෙවත් කොපි කිරීම හොර උත්තර ලීවීමට ද, යන්න දැරීම තහනම් ය. තවත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයක් දෙස බැලීම ද නොකළ යුතුය. වෙන අයදුම්කරුවෙකුට උදව් දීමෙන් ද, වෙන අයදුම්කරුවෙකුගෙන් හෝ පුද්ගලයෙකුගෙන් හෝ උදව් ලබා ගැනීමෙන් ද සම්පූර්ණයෙන්ම වැළකිය යුතුය. උත්තර ලියා සම්පූර්ණ වූ සෑම කඩදාසියක්ම ලියමින් සිටින කඩදාසි යට තබා ගත යුතුය. ලියන කඩදාසි මේසය මත විසුරුවා නොදැමිය යුතුය.

14. ප්‍රශ්න පත්‍රයකට උත්තර ලියන අතරතුර මොනම කරුණක් නිසාවත් ස්වල්ප වේලාවකටවත් විභාග ශාලාවෙන් පිටවී යාමට කිසිම අපේක්ෂකයෙකුටම ඉඩදෙනු නොලැබේ. එහෙත් යම්කිසි හදිසි කරුණක් නිසා විභාගාපේක්ෂකයෙකුට ඉන් පිටත යන්නට උවමනා වුවහොත් විභාග ශාලාධිපතිගේ සහකාර නිලධාරියෙකුගේ සුපරීක්ෂාකත්වය යටතේ විභාග ශාලාවෙන් ඔහුට ස්වල්ප වේලාවකට පිටතට යාමට අවසර දෙනු ලැබේ. එසේ පිටතට යාමට පෙරත් නැවත විභාග ශාලාවට ඇතුළු වන විටත් ඔහු සෝදිසියකට භාජනය විය යුතුය.

15. විභාග ශාලාවේදී පිළිතුරු පිළිතුරු ලියන විට විභාගය පටන් ගැනීමට පෙර හෝ නියම විභාග අපේක්ෂකයකු වෙනුවට ව්‍යාජ අපේක්ෂකයෙකු පෙනී සිටීම දඬුවම් ලැබිය යුතු ක්‍රියාවකි. අනන්‍යතා පත්‍ර වෙනස් කිරීම හෝ බොරු අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කිරීමත් කෙනෙකුගේ අනන්‍යතා සහතිකයේ වෙනස් කිරීමක් එබඳු වරදවල් ය. විභාගාපේක්ෂකයනී එවැනි වරදට අසු නොවිය යුතුය.

16. විභාග අපේක්ෂකයෙකු නොවන අයෙක් කිසිම අපේක්ෂකයෙකුට අයථා අන්දමින් වංචා සහගත ලෙස උදව් දීම බරපතල වරදක් ලෙස සළකනු ලැබේ.

විභාග අපේක්ෂකයන් විසින් තමන්ගේ පරෙස්සම සඳහා පහත සඳහන් උපදෙස් අනුව ක්‍රියා කළ යුතුය.

i. විභාගය පටන් ගන්නා නියමිත වේලාවට සෑහෙන් පමණ කලින් විභාග ශාලාවට පැමිණෙන්න. එක් එක් ප්‍රශ්න පත්‍රය පටන් ගැනීමට නියමිත වේලාවට යටතේ පිරිසෙයින් විනාඩි 10කට හෝ 15කට කළින් විභාග ශාලාවට පැමිණ සිටීම සෑහේ. විභාග ශාලාව පිහිටා ඇති ස්ථානය හරිහැටි නොදත් විට විභාගය පටන් ගන්නා දිනයට කලින් ඒ ගැන සොයා බලා නියම ස්ථානය හරි හැටි දැන සිටිය යුතුය.

ii. යම්කිසි විෂයයකට ඇතුළත්වීම ගැන හෝ යම් විෂයයකට පෙනී සිටීමට ඇති සුදුසුකම් ගැන හෝ සැකයක් ඇති වූ විට එම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීමට පටන් ගැනීමට පෙර විභාගශාලාධිපතින්ට ඒ බැව් සැළකර එම සැකය දුරුකර ගත යුතුයි. එලෙස ක්‍රියා නොකිරීම එම විෂයය හෝ විෂයයන් සම්බන්ධයෙන් තමන්ගේ විභාගපේක්ෂකත්වය අවලංගුවී යාමට හේතු විය හැකිය.

iii. විභාගයට පෙනී සිටීමේදී අපේක්ෂකයන් සෑම විෂයයකටම පෙනී සිටින විට අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කළ යුතුය. අනන්‍යතාවය ඔප්පු කිරීම සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවේදී ඉදිරිපත් නොකළහොත් ඔහුගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ තිබේ. යම් හෙයකින් ඒ සඳහා අවශ්‍ය ලියවිලි විභාගශාලාවට ගෙන ඒමට අමතක වුවහොත් ඒ බැව් විභාගශාලාධිපතින්නට දන්වා විභාග අවසන් වීමට පෙර එය ඉදිරිපත් කිරීමට මං සළසා ගත යුතුය.

iv. විභාගය සඳහා සාමාන්‍යයෙන් සම්මත වර්ගයකට අයත් ලිපි ද්‍රව්‍ය (එනම්, ලියන කඩදාසි, තීන්ත පොවන කඩදාසි, ලැජර් කඩදාසි, සාරාංශ ලියන කඩදාසි) ආදිය සපයනු ලැබේ. සාමාන්‍යයෙන් කාටත් බෙදා දෙන වර්ගයකට වෙනස් වූ හෝ අමුතු මොස්තරයක ලිපි ද්‍රව්‍ය ඔබට ලැබුණහොත් ඒ බව නොපමාව විභාගශාලාධිපතිට දැන්විය යුතුයි. විභාග ශාලාවේදී ඔබට දෙනු ලබන කඩදාසි හැර වෙන මොනම කඩදාසියක්වත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නොකළ යුතුයි. ඉතිරි වන කඩදාසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිදු නොකර නැවත ප්‍රයෝජනයට ගත හැකි වන සේ ඔබගේ ලියන මේසය මත තබන්න. ඔබට ලඝුගණක චක්‍ර සපයන ලද නම් ඒවා පරිස්සමින් පාවිච්චි කොට ඔබේ ලියන මේසය මත තිබෙන්නට හැරිය යුතුය.

v. විභාගාපේක්ෂකයන් තම තමන්ගේ පෑන්, පැන්සල්, තීන්ත කුඩු, මකන, රෙදි කෑළි, අඩිකෝදු, ජ්‍යාමිතික උපකරණ, පාට පැන්සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතුයි.

vi. තමන් පාවිච්චි කරන සෑම කඩදාසියකම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේදී නොපමාව තන්ගේ විභාග අංකය හා විභාගයේ නමත් පැහැදිලි ලෙස ලියන්න. කඩදාසියේ දෙපැත්තේම පැහැදිලිව ද පිරිසිදුව ද උත්තර ලියන්න. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු අනික් කොටස පටන් ගැනීමට පෙර එක රූලක්වත් හිස්ව තිබිය යුතුයි. සම්පූර්ණ ප්‍රශ්නයකට උත්තර ලිවීමෙන් පසු රූලක් හෝ රූල් කීපයක් හෝ හිස්ව තබන්න. ලියන සෑම දෙයක්ම එක ගොඩේ තෝරා බේරා ගන්නට නොහැකි ලෙස නොලිය යුතුයි.

vii. උත්තර ලියන කඩදාසියෙහි වම් පැත්තේ තීරය වෙන්කර ඇත්තේ ප්‍රශ්නවල අංක ලිවීම සඳහා ය. දකුණු පැත්තේ තීරය වෙන්කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නොලිවිය යුතුයි. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවල අංක වරදවා යෙදීම ව්‍යාකූලත්වයට හේතුවන බැවින් ප්‍රශ්න අංක ඉතා පරෙස්සමින් නිවැරදි ලෙස යෙදිය යුතුය.

viii. අනිවාර්ය ප්‍රශ්න ද, තෝරා ගත යුතු අන් ප්‍රශ්න ද සම්බන්ධව ප්‍රශ්න පත්‍රයේ මුලින්ම සඳහන් කොට ඇති උපදෙස් ඉතා පරෙස්සමින් නිවැරදි ලෙස යෙදිය යුතුය.

ix. ගණිත ප්‍රශ්නවලට උත්තර සපයන විට ගැන බැලීම සහ කටුවැඩ ඒ ඒ ගණන් සෑදීමේ කොටසක් වශයෙන් අනුක්‍රමයෙන් විස්තර ලෙස දැක්විය යුතුය. අවශ්‍ය තැන්වල අඳිනු ලබන රූප සටහන් හා චිත්‍ර ආදිය නිවැරදිව සෑහෙන පමණ විශාලවද තිබිය යුතුයි. පිටු කීපයකට යන දිග පිළිතුරුවලදී එක පිටුවක අඳින ලද රූප සටහන් සම්බන්ධයෙන් ඊළඟ පිටුවලදීත් සිත් යොමුකර විය යුතු අවස්ථාවලදීත් ඒ රූප සටහන් නැවතත් ඇඳ පෙන්වීම යෝග්‍ය වේ.

x. එක් එක් ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයා අවසන් වූ විට උත්තර ලියන ලද කඩදාසි සියල්ලම ප්‍රශ්නවලට උත්තර ලියූ පිළිවෙල අනුව එකතුකොට වම් පැත්තේ ඉහළ කෙළවරවල් තමන්ට සපයන ලද නූල් කැබැල්ලෙන් නොගැලවී යන පරදි එකට තබා අමුණා ගැටගසන්න. දකුණු පැත්තේ උඩ කෙළවරවල් එකට තබා ගැට නොගසන්න.

xi. ඔබගේ උත්තර පත්‍රය විභාගශාලාධිපතින්ට හෝ ඔවුන්ගේ සහකාර මහතකුට හෝ සියතින්ම භාරදිය යුතුය. නැතහොත් ඒවා එකතු කරන තුරු ඔබේ අසුනේම වාඩිවී සිටිය යුතුය. මෙසේ නොකරීම ඇතැම් විට ඔබගේ උත්තර පත්‍රය නැතිවී යාමටද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නොවුවකු සේ සලකණු ලැබීමටද හේතු විය හැකිය. මොනම කරුණක් නිසාවත් ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාවේ සේවය කරන පියන් කෙනෙකුට හෝ වෙනයම් සේවකයකුට හෝ බාර නොදිය යුතුය.

xii. යම්කිසි කරුණත් නිසා විභාග ශාලාධිපතින්ට හෝ ඔහුගේ සහකාර මහතෙකුට හෝ කථා කිරීමට අවශ්‍ය වූ විටද කඩදාසි ආදිය අවශ්‍ය වූ විටද තම ආසනයෙන් නොනැගිට අත පමණක් එසවිය යුතුය.

විභාග කොමසාරිස් ජනරාල්.

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව,
පැලවත්ත,
බත්තරමුල්ල.

# තනතුරු - ඇබෑර්තු

## වෘත්තීය හා කාර්මික පුහුණු අමාත්‍යාංශය

කාර්මික අධ්‍යාපන සංවර්ධන ව්‍යාපෘතිය [(2197-SRI (SF)]

ආසියානු සංවර්ධන බැංකුවේ මූල්‍යාධාර සැපයෙන කාර්මික සංවර්ධන ව්‍යාපෘතිය, වෘත්තීය හා කාර්මික පුහුණු අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක කරනු ලැබේ. කාර්මික ශිල්පීන් හා තාක්ෂණ ශිල්පීන් සැපයුම හා ඉල්ලුම අතර පරතරය පියවීම සඳහා වන රජයේ ක්‍රමෝපායට පහත සඳහන් අයුරින් ආධාර කිරීම ව්‍යාපෘතියේ අරමුණවේ.

iv. කාර්මික ශිල්පී අධ්‍යාපනය සැපයීම සඳහා තාක්ෂණ විද්‍යා විද්‍යාල (CoTs) ප්‍රබල කිරීම.

v. වෙළඳපොල කෙරෙහි ප්‍රතිචාරි කාර්මික අධ්‍යාපන හා පුහුණු (TEVT) පද්ධතියකට ආධාර සැපයීම සඳහා වෘත්තීය හා කාර්මික පුහුණු අමාත්‍යාංශය (MV & TT) හා අදාළ ආයතන ප්‍රබල කිරීම සහ

vi. කාර්මික හා තාක්ෂණික අධ්‍යාපනය කෙරෙහි අවධානය යොමු කරන වෘත්තීය තාක්ෂණ විද්‍යා විශ්ව විද්‍යාලය (Univotec) පිහිටුවීම.

ආසියානු සංවර්ධන බැංකුව (ADB) මගින් ආධාර සැපයුණු නිපුණතා සංවර්ධන ව්‍යාපෘතියේ (SDP) ප්‍රතිපාදන මත විශේෂයෙන් ම ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) රාමුව මත, ව්‍යාපෘතිය ගොඩ නංවනු ලැබේ.

ජාතික වෘත්තීය සුදුසුකම් 5 -7 මට්ටම් කේන්ද්‍ර කර ගනිමින්, ගුණාත්මක, කාර්යක්ෂම හා තිරසර කාර්මික අධ්‍යාපන හා වෘත්තීය පුහුණුව සුසාධ්‍යකරණය කිරීම, ආධාර කිරීම සහ සහතික කිරීම සඳහා වෘත්තීය හා කාර්මික පුහුණු අමාත්‍යාංශය හා අදාල ආයතන ශක්තිමත් කිරීම ව්‍යාපෘතිය මගින් කරනු ඇත. කාර්මික අධ්‍යාපන හා වෘත්තීය පුහුණු ක්‍ෂත්‍රයේ තාක්ෂණ ශිල්පීන්ගේ හා සුදුසුකම් ලත් උපදේශකවරුන්ගේ හිඟය පිරිමසාලීම සඳහා සහ ශිෂ්‍යයන්ට හා කාර්මික අධ්‍යාපන හා වෘත්තීය පුහුණු කෂේත්‍රයේ නියැලෙන්නට උපාධියකට යොමු වන විකල්ප අධ්‍යාපනයක් හා වෘත්තීය ප්‍රගමන මාර්ගයක් සැපයීම සඳහා ද වෘත්තීය තාක්ෂණ විශ්ව විද්‍යාලය පිහිටුවීමට ව්‍යාපෘතිය විසින් රජයට ආධාර කරනු ලැබේ. අනෙකුත් කාර්ය අතර, ව්‍යාපෘතිය විසින් කාර්මික අධ්‍යාපනවේදී (B. Tech.Ed.) තාක්ෂණ විද්‍යාවේ දී (B. Tech.) උපාධි වැඩ සටහන් සංවර්ධනය කිරීම සහ එම වැඩසටහන් සපයන වෘත්තීය තාක්ෂණ විද්‍යා විශ්ව විද්‍යාලය සමන්විත වන ආයතනවල පහසුකම් හා උපකරණ වැඩිදියුණු කිරීමද සිදුකරනු ලැබේ. තෝරා ගත් විෂය ක්ෂේත්‍රවලින් 5 හා 6 මට්ටම්වල ජාතික වෘත්තීය සුදුසුකම් අත්කර ගැනීමට පුහුණුලාභීන්ට පහසුකම් සැපයීමෙන් යෝජිත තාක්ෂණ විද්‍යාල මගින් කර්මාන්තයට සෘජු ව ආධාර කරනු ලැබේ.

2006 වර්ෂයේ සිට අවුරුදු 5ක කාල සීමාවක් තුළ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනු ලැබේ.

කොළඹ පිහිටි ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ඒකකයෙහි (PLU) පහත සඳහන් තනතුරු පිරවීම සඳහා ශ්‍රී ලංකාවේ පුරවැසියන් වන යෝග්‍ය සුදුසුකම් ලත් පළපුරුදු අයදුම්කරුවන්ගෙන් ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

01. ව්‍යාපෘති ඉංජිනේරු තනතුර.-

*රාජකාරි හා වගකීම්.-*

1. පළාත් මට්ටමෙන් ඩිප්ලෝමා මට්ටමේ පුහුණු වැඩසටහන් මෙහෙයවීම සඳහා වැඩහල් හා වෙනත් පහසුකම් වැඩිදියුණු කිරීම/අලුත්වැඩියාවන් සැලසුම් කිරීම හා ක්‍රියාත්මක කිරීම.
2. සිවිල් ඉදිකිරීම් කාර්යයන් මගින් සිදුකරන වැඩිදියුණු කිරීම්/අළුත්වැඩියාවන් සඳහා පිරිවැය ඇස්තමේන්තු හා සැලසුම් චිත්‍ර පිළියෙල කිරීම.
3. පළාත් මට්ටමේ එක් එක් තාක්ෂණ විද්‍යා විද්‍යාලය සඳහා නඩත්තු සැලැස්මක් පිළියෙල කිරීම, යෝජිත වෘත්තීය තාක්ෂණ විද්‍යා විශ්ව විද්‍යාලයේ යටිතල පහසුකම් කාර්යයන් සඳහා පූර්ණ සැලැස්මක් පිළියෙල කිරීම.
4. වෘත්තීය තාක්ෂණ විද්‍යා විශ්ව විද්‍යාලය සඳහා පිරිවැය ඇස්තමේන්තු සහිත ව සවිස්තර ප්‍රමාණ ගණන් පිළියෙල කිරීම.
5. ව්‍යාපෘතියේ සිවිල් ඉදිකිරීම් කාර්යයන් ක්‍රියාත්මක කිරීම මනාව අධීක්ෂණය කිරීම සහ අනුමැතිය සඳහා නිර්දේශ ඉදිරිපත් කිරීම.
6. සිවිල් ඉදිකිරීම් කාර්යයන් හි ප්‍රසම්පාදන අංගය සඳහා සහභාගි වීම.
7. ව්‍යාපෘති සහභාගීත්ව ආයතන, පාර්ශ්වකරුවන් හා වෙනත් අවශ්‍ය පාර්ශ්වයන් සමග සමීප සම්බන්ධතා පවත්වාගෙන යාම.
8. ප්‍රධාන ආයතන, ව්‍යාපෘති නියෝජක ආයතන ආදියට අවශ්‍ය පරිදි හා අවශ්‍ය වූ විට වාර්තා පිළියෙල කිරීම.

*සුදුසුකම් හා පළපුරුද්ද.-*

පිළිගත් වෘත්තීය ආයතනයක වරලත්/සාමූහික සාමාජිකත්වය/අදාළ ක්‍ෂත්‍රයේ පශ්චාත් උපාධියක් ;

*සහ*

ප්‍රධාන ව්‍යාපෘතිවල ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ අවම වශයෙන් වසර 08 ක පශ්චාත් සුදුසුකම් පළපුරුද්ද ;

*හෝ*

ප්‍රධාන ව්‍යාපෘතිවල I වැනි පන්ති මට්ටමේ අවම වශයෙන් වසර 05 ක පළපුරුද්ද සමග රජයේ දීප ව්‍යාප්ත සේවාවක අදාළ ක්‍ෂත්‍රයේ ඒ හා සමාන තත්වයක I වැනි පන්තියේ නිලධාරියෙකු වීම ;

*සහ*

ශ්‍රී ලංකාවේ වෘත්තීය හා කාර්මික පුහුණු අංශය, එහි ප්‍රතිපත්තිමය රාමුව හා එහි මෙහෙයුම් පිළිබඳ මනා අවබෝධය.

*වෘත්තීය නිපුණතා.-*

1. ව්‍යාපෘතියට අවශ්‍යය කරනු ලබන පරිදි තාක්ෂණ සේවා සැපයීම හා ව්‍යාපෘති අධ්‍යක්ෂට හා නියෝජ්‍ය ව්‍යාපෘති අධ්‍යක්ෂට සහායවීම.

2. අවශ්‍ය විශේෂඥතා ක්ෂත්‍රයට අදාළ ව්‍යාපෘති කාර්යයන් ඉටුකිරීමට ස්වාධීනව කටයුතු කිරීමේ නිශ්චය වූ හැකියාව.

3. අනෙක් කණ්ඩායම් සාමාජිකයන්ගේ විශ්වාසය හා සහයෝගය උත්පාදනය කරමින් කණ්ඩායම් පරිසරයක කාර්යක්ෂමව කටයුතු කිරීමේ හැකියාව ක්‍රියාත්මක කිරීමේ ගැටලු විචාරාත්මකව හා සංගතව විශ්ලේෂණයේ හා විසඳීමේ හැකියාව.

4. පරිගණක සාක්ෂරතාව.

5. ලිඛිත හා භාෂක ඉංග්‍රීසි පිළිබඳ උසස් මට්ටමේ ප්‍රවීණතාව.

අයදුම් පත්‍ර භාර ගැනීමේ අවසන් දින වන විට අයදුම්කරුවන් වයස අවුරුදු 57ට අඩුවිය යුතුය.

*වේතනය.-* අයදුම්කරුවන්ගේ සුදුසුකම් හා පළපුරුද්ද මත ගිවිස ගත හැකිය. (2007.04.05 අංක 33 දරණ කළමනාකරණ චක්‍රලේඛය මත පදනම් වේ.)

*පොදු කොන්දේසි.-*

4. සේවා නියුක්ත අර්ථසාධක අරමුදල (EPF) සඳහා සේවා නියුක්තකයාගේ හා සේවා යෝජකයාගේ දායකත්වය පිළිවෙලින් වැටුපෙන් 8% හා 12% වන අතර සේවා නියුක්ත භාර අරමුදල (ETF) සඳහා සේවා යෝජකයාගේ දායකත්වය වැටුපෙන් 3% ක් වේ.

5. තනතුරු පූර්ණ කාලීනය. මූලිකව අවුරුදු 01ක කාලසීමාවක් තුළ කොන්ත්‍රාත් පදනම මත පිහිටුවා කාර්ය සාධනය පදනම් කර අවුරුද්දෙන් අවුරුද්ද දීර්ඝ කරනු ලැබේ.

6. විදේශ ආධාර සැපයෙන ව්‍යාපෘතිවල පළපුරුද්ද අමතර සුදුසුකමකි.

අවශ්‍ය සුදුසුකම් සහිත අයදුම්කරුවන් සංක්ෂිප්ත ලැයිස්තුගත කර සම්මුඛ පරීක්ෂණ සඳහා කැඳවනු ලැබේ.

ඥාතීන් නොවන නිර්දේශකයන් දෙදෙනෙකුගේ නම් හා ලිපිනයන්ද සමග සම්පූර්ණ කරන ලද ජීව දත්ත හා සහතික පත්‍රවල ඡායා පිටපත් සමග වූ ඉල්ලුම්පත් ලියාපදිංචි තැපෑලෙන් 2008 අගෝස්තු මස 18 දිනට පෙර පහත සඳහන් ලිපිනයට එවිය යුතුය. ලිපි කවරයේ ඉහළ වම් කෙළවරේ තනතුරෙහි නම සඳහන් කරන්න.

ලේකම්,
වෘත්තීය හා කාර්මික පුහුණු අමාත්‍යාංශය,

2008 ජූලි මස 04 දින දීය,
නිපුණතා පියස,
අංක 35 4/2, ඇල්විටිගල මාවත,
කොළඹ 05.

07-555

---

**කෘෂිකර්ම දෙපාර්තමේන්තුව**

**කෘෂිකර්ම සංවර්ධන හා ගොවිජන සේවා අමාත්‍යාංශය**

ආර්ථික විද්‍යාඥ සහකාර තනතුර III ශ්‍රේණියට බඳවා ගැනීම

කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ III ශ්‍රේණියේ ආර්ථික විද්‍යාඥ සහකාර තනතුර සඳහා ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම් පත් කැඳවනු ලැබේ.

02. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට අයදුම්කරුවන්ගේ වයස අවුරුදු 18 ට නොඅඩු විය යුතු අතර අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. දැනටමත් රජයේ සේවයේ හා පළාත් රාජ්‍ය සේවයේ නියුක්තවූවන්ට උපරිම වයස් සීමාව බලපානු නොලැබේ.

03. මෙම තනතුරට අදාල වැටුප් පරිමාණය රා. පරි. ච. ලේ 06/2006 (iv) හි - MN-6-2006-A කේත අංකය යටතේ රු. 17,680 - 10 x 320 - 11 x 365 - 15 x 450 - රු. 31,645 වේ.

04. මෙම තනතුර ස්ථිරය, විශ්‍රාම වැටුප් සහිතය, වැන්දඹු හා අනත්දරු/වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් ගෙවිය යුතුය.

05. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 07/2007 (1) විධිවිධාන පරිදි රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම අනුව මෙම තනතුරට පත්වී වසර 05 ක් ඇතුලත තනතුරට නියම කර ඇති දෙවැනි රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය ලබා ගත යුතුය.

*06. අධ්‍යාපන සුදුසුකම්.-*

රජයේ පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබාගත් ආර්ථික විද්‍යාව/සංඛ්‍යා ලේඛණ හෝ ගණිතය පිළිබඳව විශේෂ උපාධියක් ලබා තිබීම.

(අයදුම්පත් ඉදිරිපත් කල යුතු අවසාන දිනය වනවිට සියලුම අයදුම්කරුවන් මෙම නිවේදනයේ සඳහන් සියලුම සුදුසුකම් සපුරා තිබිය යුතුය)

07. *අයදුම් කළ යුතු ක්‍රමය.-*

i. මෙම නිවේදනයේ අවසානයේ පළකර ඇති ආදර්ශ ආකෘතිය අනුව, 1 සිට 8 දක්වා ඡේද පළමුවන පිටුවේ ඇතුළත් වන සේ [A-4 (21cm x 29cm)] කඩදාසියක පමණක් දෙපැත්තේම පිළියෙල කල යුතුය.

ii. අයදුම්පත සමග සුදුසුකම් සනාථ කිරීමේ ලිපි ලේඛනවල ඡායා පිටපත් අමුණා එවිය යුතුය.

iii. නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත් 2008.08.15 දින හෝ ඊට ප්‍රථම ලැබෙන සේ, කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල්, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, තැ. පෙ. 01, පේරාදෙණිය යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත බහා එවන ලිපි කවරයේ වම්පස ඉහල කෙලවරේ "ආර්ථික විද්‍යාඥ සහකාර තනතුර සඳහා අයදුම්පත" යනුවෙන් සඳහන් කළ යුතුය.

iv. අසම්පූර්ණ හා ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලබන අතර තැපෑලේදී සිදුවිය හැකි නැතිවීම් හෝ ප්‍රමාද වීම් ගැන කෙරෙන කිසිදු පැමිණිල්ලක් සලකා බලනු නොලැබේ.

v. දැනටමත් රාජ්‍ය සේවයේ, පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත වූවන් අයදුම්පත් ඉදිරිපත් කළ යුත්තේ තම ආයතන ප්‍රධානියා මගිනි.

08. *බඳවා ගැනීමේ ක්‍රමය.-* මූලික සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට භාජනය කිරීමෙන් සුදුස්සන් තෝරා ගනු ලැබේ.

ආචාර්ය සී. කුඩාගමගේ,
කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල්.

2008 ජූලි මස 04 දින,
කෘෂිකර්ම දෙපාර්තමේන්තුව,
තැ. පෙ. 01,
පේරාදෙණිය.

(කාර්යාලීය ප්‍රයෝජනය සඳහා)

**ආදර්ශ අයදුම් පත්‍රය**

කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ආර්ථික විද්‍යාඥ සහකාර තනතුර III ශ්‍රේණියට බඳවා ගැනීම

01. මුලකුරු සමග නම ඃ (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)
උදා : SILVA A. B. :————.

02. සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්) :————.

03. ජාතික හැඳුනුම්පත් අංකය : | | | | | | | | | | |

04. ස්ථිර ලිපිනය ඃ (සිංහලෙන්) :————.
ස්ථිර ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.

05. ස්ත්‍රී/පුරුෂ භාවය : ස්ත්‍රී - 1 පුරුෂ - 0 ☐
(අදාල අංකය කොටුව තුළ ලියන්න)

06. උපන් දිනය : වර්ෂය : ☐☐☐☐ මාසය : ☐☐ දිනය : ☐☐

07. ඉල්ලුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස :————.

අවුරුදු : ☐☐ මාස : ☐☐ දින : ☐☐

08. විවාහක/අවිවාහක බව විවාහක - 1 අවිවාහක - 2 ☐
(අදාල අංකය කොටුව තුළ ලියන්න)

09. අධ්‍යාපන සුදුසුකම් :—

i. උපාධිය :————.
ii. විශ්ව විද්‍යාලය :————.
iii. උපාධියට හැදෑරූ විෂයයන් :————.
iv. උපාධිය වලංගු වන දිනය :————.

10. *අයදුම්කරුගේ සහතිකය.-* මෙම ඉල්ලුම්පත්‍රයේ සපයන ලද තොරතුරු සත්‍ය හා නිවැරදි බව මෙයින් සහතික කරමි. මෙහි ඇතුළත් තොරතුරු වලින් කිසිවක් අසත්‍ය හෝ වැරදි බව, මා තෝරා ගැනීමට පෙර අනාවරණය වුවහොත්, මා නුසුදුස්සකු වීමට යටත් වන බවත්, පත්කිරීමෙන් පසු අනාවරණය වුවහොත් කිසිදු වන්දියක් නොගෙවා මා සේවයෙන් පහ කිරීමට යටත් වන බවත් මම දැන සිටිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

11. දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය(දැනටමත් රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා පමණි.)

............... මහතා/මිය/මෙනවිය............. තනතුරක් දරමින්,....................... දින සිට මෙම අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ/කාර්යාලයේ/පළාත් සභාවේ සේවය කරන බව සහතික කරමි. ඔහු/ඇය ඉහත කී තනතුරට තෝරා ගනු ලැබුවහොත් දැනට දරන තනතුරෙන්/සේවයෙන් නිදහස් කළ හැකි/නොහැකි බවද දන්වා සිටිමි.

————,
දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ
බලයලත් නිලධාරියාගේ අත්සන.

දිනය :————.

තනතුර :————.

ලිපිනය :————.
(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න).

07-604

---

**කෘෂිකර්ම දෙපාර්තමේන්තුව**

කෘෂිකර්ම සංවර්ධන හා ගොවිජන සේවා අමාත්‍යාංශය

**බීජ කාර්මික තනතුරට බඳවා ගැනීම**

කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ බීජ කාර්මික තනතුරේ පුරප්පාඩු පිරවීම සඳහා පහත සුදුසුකම් සපුරාලන ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

02. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට අයදුම්කරුවන්ගේ වයස අවුරුදු 18 ට නොඅඩු විය යුතු අතර අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. දැනටමත් රජයේ සේවයේ හා පළාත් රාජ්‍ය සේවයේ නියුක්තවූවන්ට උපරිම වයස් සීමාව බලපානු නොලැබේ.

03. මෙම තනතුරට අදාල වැටුප් පරිමානය රා. පරි. ච. ලේ. 06/2006(iv) හි එම්. එන්. 1/2006 කේත අංකය යටතේ රු. 12,920 - 120 x 10 - 140 x 11 - 210 x 10 - 290 x 10 - රු. 20,660 වේ.

04. මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය, වැන්දඹු හා අනත්දරු/වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් ගෙවිය යුතුය.

05. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 07/2007 (1) විධිවිධාන පරිදි රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම අනුව මෙම තනතුරට පත්වී වසර 5 ක් ඇතුලත තනතුරට නියම කර ඇති දෙවැනි රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය ලබාගත යුතුය.

06. පහත සඳහන් මූලික අධ්‍යාපන සුදුසුකම් හා වෘත්තීය සුදුසුකම් ලබා තිබීම අවශ්‍යය.

6.1 *අධ්‍යාපන සුදුසුකම් .-*

භාෂාව, හෝ සාහිත්‍ය, ගණිතය, විද්‍යාව සහිතව දෙවරකට නොවැඩි වාර ගණනකදී විෂයයන් 6 කින් අ. පො. ස. (සා. පෙළ) විභාගය සමත්වීම (මෙයින් විෂයයන් 5 ක් එකවර සමත්ව තිබිය යුතුය.)

6.2 *වෘත්තීය හා වෙනත් සුදුසුකම්.-* ප්‍රායෝගික කෘෂිකර්ම පාඨශාලා සහතිකය

*හෝ*

කුණ්ඩසාලේ, අඟුණකොළපැලැස්ස, පැල්වෙහෙර, බිබිල, ලබුදූව, වාරියපොල, වවුනියාව, අනුරාධපුරය, කරපිංච යන ශ්‍රී ලංකා කෘෂිකර්ම විද්‍යාල මගින් පිරිනමනු ලබන දෑඅවුරුදු කෘෂිකර්ම ඩිප්ලෝමා සහතිකය ලබා තිබීම ;

*හෝ*

හාඩි කාර්මික ආයතනයෙන් පිරිනමනු ලබන කෘෂිකර්මය පිළිබඳ ඩිප්ලෝමා සහතිකය ලබා තිබීම ; හෝ

ඇක්වයිනාස් විද්‍යාලයේ කෘෂිකර්මය පිළිබඳ ඩිප්ලෝමා සහතිකය ලබා තිබීම ;

*හෝ*

උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ තාක්ෂණ විද්‍යාල මගින් පිරිනමන ලද ජාතික තාක්ෂණික ඩිප්ලෝමා සහතිකය ලබා තිබීම ; හෝ

රජය විසින් අනුමත ආයතනයක් මගින් පිරිනමනු ලබන දෑඅවුරුදු කෘෂිකර්ම ඩිප්ලෝමා සහතිකය ලබා තිබීම.

***සැලකිය යුතුයි.***- අයදුම්පත් ඉදිරිපත් කළ යුතු අවසන දිනය වනවිට සියලුම අයදුම්කරුවන් මෙම නිවේදනයේ සඳහන් සියලුම සුදුසුකම් සපුරා තිබිය යුතුය.

07. *අයදුම් කළ යුතු ක්‍රමය.-*

*(අ)* මෙම නිවේදනයේ අවසානයේ පළකර ඇති ආදර්ශ ආකෘතිය අනුව 1 සිට 8 දක්වා ඡේද පළමුවන පිටුවේ ඇතුළත් වන සේ (A-4 (21cm x 29cm) කඩදාසියක) පමණක් දෙපැත්තේම පිළියෙල කළ යුතුය.

*(ආ)* නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත් 2008.08.15 දින හෝ ඊට ප්‍රථම ලැබෙනසේ, කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල්, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, තැ. පෙ. 01, පේරාදෙණිය යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත බහා එවන ලිපි කවරයේ වම්පස ඉහළ කෙලවරේ "බීජ කාර්මික තනතුර සඳහා අයදුම්පත" යනුවෙන් සඳහන් කළ යුතුය.

*(ඇ)* අයදුම්පත සමග සුදුසුකම් සනාථ කිරීමේ ලිපිලේඛනවල ඡායා පිටපත් අමුණා එවිය යුතුය.

*(ඈ)* අසම්පූර්ණ හා ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලබන අතර තැපෑලේ දී සිදුවන නැතිවීම් හා ප්‍රමාදවීම් ගැන කෙරෙන කිසිදු පැමිණිල්ලක් සලකා බලනු නොලැබේ.

*(ඉ)* දැනටමත් රාජ්‍ය සේවයේ හා පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත වූවන් අයදුම්පත් ඉදිරිපත් කළ යුතු වන්නේ තම ආයතන ප්‍රධානියා මගිනි.

08. *බඳවා ගැනීමේ ක්‍රමය.-* මූලික සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට භාජනය කර සුදුස්සන් තෝරා ගනු ලැබේ.

ආචාර්ය සී. කුඩාගමගේ,
කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල්.

2008 ජූලි මස 04 වැනි දින,
කෘෂිකර්ම දෙපාර්තමේන්තුව,
පේරාදෙණිය.

| |
|---|
| |

(කාර්යාල ප්‍රයෝජනය සඳහා)

**ආදර්ශ අයදුම් පත්‍රය**

කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ බීජ කාර්මික තනතුරට
බඳවා ගැනීම සඳහා වූ අයදුම්පත

01. නම :————.

1.1 මුලකුරු සමග නම :
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) උදා SILVA A. B. :————.

1.2 සම්පූර්ණ නම :
(සිංහලෙන්/දෙමළෙන්) :————.

1.3 ජාතික හැඳුනුම්පත් අංකය : | | | | | | | | | | |

02. ස්ථිර ලිපිනය :
ස්ථිර ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.

03. ස්ත්‍රී/පුරුෂ භාවය : ස්ත්‍රී 1 පුරුෂ 0 | |
(අදාල අංකය කොටුව තුළ ලියන්න)

3.1 උපන් දිනය : වර්ෂය | | | | | මාසය | | | දිනය | | |

3.2 ඉල්ලුම් පත්‍ර භාරගන්නා අවසාන දිනට වයස :

අවුරුදු | | | මාස | | | දින | | |

04. විවාහක/අවිවාහක බව : | |
විවාහක - 1, අවිවාහක - 2 (අදාළ අංකය කොටුව තුළ ලියන්න)

05. අධ්‍යාපන සුදුසුකම් (භාෂා මාධ්‍ය සමග) :

(අ) අ. පො.ස. (සා. පෙළ) විභාගය :

| | *පළමු වතාව* | *දෙවන වතාව* |
|---|---|---|
| වර්ෂය හා මාසය : | ————. | ————. |
| විභාග අංකය : | ————. | ————. |
| භාෂා මාධ්‍යය : | ————. | ————. |

| *පළමු වතාව :* | | *දෙවන වතාව :* | |
|---|---|---|---|
| *විෂය* | *සාමාර්ථය* | *විෂය* | *සාමාර්ථය* |
| 1 ————. | ————. | 1 ————. | ————. |
| 2 ————. | ————. | 2 ————. | ————. |
| 3 ————. | ————. | 3 ————. | ————. |
| 4 ————. | ————. | 4 ————. | ————. |
| 5 ————. | ————. | 5 ————. | ————. |
| 6 ————. | ————. | 6 ————. | ————. |
| 7 ————. | ————. | 7 ————. | ————. |
| 8 ————. | ————. | 8 ————. | ————. |
| 9 ————. | ————. | 9 ————. | ————. |

(ආ) අ. පො. ස. (උසස් පෙළ) විභාගය :

විභාග අංකය :——————.

වර්ෂය :——————.

| *විෂය* | *සාමාර්ථය* |
|---|---|
| 1. ——————. | ——————. |
| 2. ——————. | ——————. |
| 3. ——————. | ——————. |
| 4. ——————. | ——————. |

06. *වෘත්තීය සුදුසුකම්.-*

| *ඩිප්ලෝමාව සහ ආයතනයේ නම* | *විභාග අංකය* | *සමත් වූ වර්ෂය* |
|---|---|---|
| | | |

07. *අයදුම්කරුගේ සහතිකය.-*

මෙම ඉල්ලුම්පත්‍රයේ මා විසින් සපයන ලද තොරතුරු සත්‍ය වූත්, නිවැරදි වූත් ඒවා බවට මෙයින් සහතික කරමි. මෙහි ඇතුළත් තොරතුරුවලින් කිසිවක් අසත්‍ය හෝ වැරදි ඒවා බව මා තෝරා ගැනීමට පෙර දැනගතහොත්, මා නුදුසුස්සකු වීමට යටත් වන බවත් පත්කිරීමෙන් පසු ඒ බව අනාවරණය වුවහොත් මට කිසිදු වන්දියක් නොගෙවා මා සේවයෙන් පහ කිරීමට යටත් වන බවත් මම දැන සිටිමි.

——————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :—————.

08. දැනට රජයේ ස්ථිර සේවයේ නියුක්ත නිලධාරීන්ට පමණක් අදාල වේ.

*දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය :*

නිලධාරියා විසින් ඉහත සඳහන් කර ඇති විස්තර පරීක්ෂා කර බැලූ බවත් ඒවා නිවැරදි බවත් අපේක්ෂකයා/අපේක්ෂිකාව ඉහත තනතුර සඳහා බඳවා ගැනීමට සුදුසුකම් ලැබුවහොත් ඔහු/ඇය දැනට දරන තනතුරෙන් නිදහස් කළ හැකි/නොහැකි බවත් සහතික කරමි.

—————,
දෙපාර්තමේන්තු ප්‍රධානියා
(නිල මුද්‍රාව තැබිය යුතුය)

පදවි නාමය :——————.
ලිපිනය :——————.
දිනය : ——————.

07-605

## මැතිවරණ දෙපාර්තමේන්තුව

### පිළිගැනීමේ නිලධාරි තනතුර

මැතිවරණ දෙපාර්තමේන්තුවේ ඉහත සඳහන් තනතුර සඳහා සුදුසුකම්ලත් අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. මෙම නිවේදනය අවසානයේ පළ කර තිබෙන ආදර්ශ ආකෘතිය අනුව ඒ4 ප්‍රමාණයේ කඩදාසිවල පිළියෙල කරන ලද අයදුම්පත් 2008 අගෝස්තු මස 25 වැනි දිනට හෝ ඊට පෙර ලැබෙන සේ මැතිවරණ කොමසාරිස්, මැතිවරණ දෙපාර්තමේන්තුව, සරණ මාවත, රාජගිරිය යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අසම්පූර්ණ සහ ආදර්ශ ආකෘතිය අනුව පිළියෙල කර නොමැති වූ මෙන්ම නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත් බහා එවන කවරයේ වම්පස ඉහළ කෙළවරේ "පිළිගැනීමේ නිලධාරි තනතුර" යනුවෙන් සඳහන් කළ යුතුය.

01. *තනතුරු නාමය.-* පිළිගැනීමේ නිලධාරි තනතුර

02. *අධ්‍යාපන හා වෙනත් සුදුසුකම්.-* සිංහල භාෂාව හෝ සාහිත්‍යය, ගණිතය/අංක ගණිතය/වාණිජ අංක ගණිතය යන විෂයයන් දෙකකට සම්මාන ඇතුළුව, සම්මාන 4 ක් සහිතව විෂයයන් 6කින් දෙවරකට නොවැඩි වාර ගණනකදී අ.පො.ස. (සා.පෙළ) හෝ ඊට සමාන හෝ උසස් හෝ විභාගයකින් සමත්වීම.

(අ) ඉංග්‍රීසි කථා කිරීමේ හා ලිවීමේ හැකියාව, දෙමළ භාෂා දැනුම අතිරේක සුදුසුකමක් වනු ඇත.

(ආ) විශිෂ්ඨ චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍යයෙන් යුක්ත වීම.

032. *වෘත්තීය සුදුසුකම්.-* රජයේ හෝ රාජ්‍ය සංස්ථාවක අදාල ක්ෂේත්‍රයේ වසර 3 ක පළපුරුද්දක් ලබා තිබීම. (සහතික මඟින් සනාථ කළ යුතුය.)

04. *මාසික වැටුප් පරිමාණය.-* රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 06-2006 (iv) හි - MNI-2006 A වැටුප් කාණ්ඩය අදාළ වේ.
රු. 13,120 - 10 x 145 - 11 x 170 - 10 x 240 - 10 x 320-රු. 22,040 වේ.

05. *වයස් සීමාව.-* අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට අයදුම්කරුවන්ගේ වයස අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. (දැනටමත් රාජ්‍ය සේවයේ නියුක්ත වූවන්ට උපරිම වයස් සීමාව බලනොපායි.)

06. *සේවය නියුක්ත කිරීමේ කොන්දේසි.-*

(i) මෙම තනතුර ස්ථිරය, විශ්‍රාම වැටුප් සහිත වන අතර වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක මුදල් ගෙවිය යුතුය.

(ii) ආයතන සංග්‍රහයේ II පරිච්ඡේදයේ 10-12 දක්වා ඡේදවල විධිවිධාන ද අදාළ වේ.

(iii) තනතුරට පත්වීමෙන් පසු වසර 05 ක් ඇතුළත 2007.05.28 දිනැති රා. පරි. චක්‍රලේඛ 7/2007 හි විධිවිධාන පරිදි රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය ලබා ගත යුතුය.

07. *බඳවා ගැනීමේ ක්‍රමය.-* ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් පවත්වා එහිදී ඉහළම ලකුණු ලබා ගත් අය අතරින් සුදුස්සෙකු තෝරා ගනු ලැබේ.

*08. වෙනත් කරුණු.-* දැනට රාජ්‍ය/පළාත් රාජ්‍ය සේවයේ තනතුරු දරන්නන් තම අයදුම්පත් දෙපාර්තමේන්තුවෙන් හෝ ආයතන ප්‍රධානියා මඟින් ඉදිරිපත් කළ යුතුය.

දයානන්ද දිශානායක,
මැතිවරණ කොමසාරිස්.

2008 ජූලි මස 25 වැනි දින,
මැතිවරණ දෙපාර්තමේන්තුව,
සරණ මාවත,
රාජගිරිය.

## මැතිවරණ දෙපාර්තමේන්තුව

### පිළිගැනීමේ නිලධාරී තනතුරට බඳවා ගැනීමේ අයදුම්පත්‍රය

01. මුලකුරු සමග නම :————.

02. සම්පූර්ණ නම :————.

03. ස්ථිර ලිපිනය :————.

04. තැපැල් ලිපිනය :————.

05. දැනට සේවයේ යෙදී සිටී නම් ආයතනයේ නම :————.

    ලිපිනය :————.

    තනතුර :————.

06. ජාතික හැඳුනුම්පත් අංකය :————.

07. ස්ත්‍රී/පුරුෂ භාවය :————.

08. උපන් දිනය : අවුරුද්ද ☐☐☐☐ මාසය ☐☐ දිනය ☐☐

    2008.08.25 දිනට වයස :

    අවුරුදු ☐☐ මාස ☐☐ දින ☐☐

09. විවාහක/අවිවාහක බව :————.

10. අධ්‍යාපන සුදුසුකම් :

| *අ.පො.ස (සා.පෙළ)* | | *අ.පො.ස (උ.පෙළ)* | |
|---|---|---|---|
| *වර්ෂය :————.* | | *වර්ෂය :————.* | |
| *විෂය* | *ලැබූ සාමාර්ථය* | *විෂය* | *ලැබූ සාමාර්ථය* |
| ————. | ————. | ————. | ————. |
| ————. | ————. | ————. | ————. |
| ————. | ————. | ————. | ————. |
| ————. | ————. | ————. | ————. |
| ————. | ————. | | |
| ————. | ————. | | |
| ————. | ————. | | |
| ————. | ————. | | |

11. *වෙනත් සුදුසුකම්.-*

    (i) ————.

    (ii) ————.

    (iii) ————.

12. අදාළ ක්ෂේත්‍රයේ පළපුරුද්ද :

    ආයතනය : ........................................................................ සිට ...................... දක්වා

13. අයදුම්කරුගේ/අයදුම්කාරියගේ සහතිකය :

.................................................................................. වන මම ඉහත සඳහන් සියළුම කරුණු සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. යම් හෙයකින් ඉහත තොරතුරු අසත්‍ය බව හෝ වැරදි බව සනාථ වුවහොත්, සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටීමේ හිමිකම අහිමි වන බව හා තනතුර සඳහා බඳවා ගැනීමෙන් පසුව සනාථ වුවහොත්, කිසිදු වන්දියක් රහිතව තනතුරෙන් පහ කිරීමට යටත් වන බවද දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

14. දැනටමත් රාජ්‍ය/පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාගේ සහතිකය.-

මෙම ඉල්ලුම්කරු වන ........................................................ ................................ මහතා/මෙනවිය/මිය දැනට මෙම අමාත්‍යාංශයේ/ දෙපාර්තමේන්තුවේ/ආයතනයේ ..................................... වශයෙන් ස්ථිර/තාවකාලික/අනියම්/පුහුණු නිලධාරියෙකු/නිලධාරිණියක ලෙස සේවය කරන බවත්, ඔහු/ඇය කිසිදු විනයානුකූල දඬුවමකට (අවවාද කිරීම් හැර) යටත් කර නොමැති බවත්, මෙම තනතුර සඳහා තෝරා ගනු ලැබුවහොත් ඔහු හෝ ඇය සේවයෙන් නිදහස් කළ හැකි/නොහැකි බවත් දන්වමි.

————,
දෙපාර්තමේන්තු /ආයතන ප්‍රධානියාගේ අත්සන.
(නිල මුද්‍රාව)

දිනය :————.
තනතුර :————.
අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව/ආයතනය :————.

07-661

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

**කෘෂිකර්ම සංවර්ධන හා ගොවිජන සේවා අමාත්‍යාංශය**

අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

**ශ්‍රී ලංකා තාක්ෂණ සේවාවේ අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ II "ආ" පන්තියේ ව්‍යාප්ති නිලධාරි සහ පර්යේෂණ සහකාර තනතුරට නිලධාරින් බඳවා ගැනීමේ තරග විභාගය - 2008**

අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ශ්‍රී ලංකා තාක්ෂණ සේවාවේ ඉහත සඳහන් තනතුරු පුරප්පාඩු පිරවීම සඳහා ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ :–

(02) අයදුම්කරුවන්ගේ වයස අවුරුදු 18ට නොඅඩු හා අවුරුදු 45ට නොවැඩි විය යුතුය. දැනටමත් රජයේ සේවයේ හා පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත වූවන්ට උපරිම වයස් සීමාව බලපානු නොලැබේ.

(03) මෙම තනතුරු සඳහා රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 07/2008 අනුව මාසික වැටුප් පරිමාණය රු. 15,005- 4x180-6x240-11x320-20x360 - රු.27,885 ක් හිමිවේ.

(04) මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු අනත්දරු/වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් ගෙවිය යුතුය.

(05) අයදුම්පත් භාරගන්නා අවසාන දිනය වන විට අයදුම්කරුවන් පහත සඳහන් මූලික අධ්‍යාපන සුදුසුකම් හා වෘත්තීය සුදුසුකම් ලබා තිබීම අවශ්‍යය.

| *තනතුර* | *අධ්‍යාපන සුදුසුකම්* | | *වෘත්තීය සුදුසුකම්* |
|---|---|---|---|
| | *අපොස (සා.පෙළ)* | *අ.පොස.(සා.පෙළ)* | |
| ව්‍යාප්ති නිලධාරි හා පර්යේෂණ සහකාර | සිංහල/දෙමළ හෝ සාහිත්‍යය, ගණිතය විද්‍යාව සහ තවත් එක් විෂයයකට සම්මාන සහිතව විෂයයන් 06කින් අ.පො.ස. (සා.පෙළ) විභාගය දෙවරකට නොවැඩි වාර ගණනාවක දී විභාගය සමත් වීම. | ජීව විද්‍යාව, කෘෂිකර්මය, රසායන විද්‍යාව, භෞතික විද්‍යාව යන විෂයයන් දෙකක් සමග විද්‍යා විෂයයන් තුනකින් අ.පො.ස. (උසස්පෙළ) එකවර සමත්වීම | කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ කෘෂිකර්ම විද්‍යාල මගින් පවත් වන ලද දෑ අවුරුදු කෘෂිකර්ම ඩිප් ලෝමා සහතිකයක් ලබා තිබීම.<br>*හෝ*<br>අම්පාර හාඩි ආයතනය විසින් පිරිනමනු ලබන ජාතික කෘෂිකර්ම ඩිප්ලෝමා සහතිකය ලබා තිබීම;<br>*හෝ*<br>නිපුණතා සංවර්ධන වෘත්තීය හා කාර්මික සංවර්ධන අමාත්‍යාංශයේ තාක්‍ෂණ විද්‍යාල මගින් පිරිනමන ලද කෘෂිකර්මය පිළිබඳ ජාතික තාක්‍ෂණික ඩිප්ලෝමා සහතිකය ලබා තිබීම;<br>*හෝ*<br>ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාල මගින් පිරිනමනු ලබන තාක්‍ෂණික ඩිප්ලෝමා (කෘෂිකර්ම විද්‍යා) සහතිකය ලබාතිබීම;<br>*හෝ*<br>රජය විසින් අනුමත වෙනත් ආයතනයක් මගින් පිරිනමනු ලබන දෑ අවුරුදු කෘෂි ඩිප්ලෝමාව<br>*හෝ*<br>ඉහත තාක්‍ෂණික සුදුසුකම්වලට සමාන යයි ශ්‍රී. ලං. තා. සේ. මණ්ඩලය විසින් පිළිගනු ලබන වෙනත් සුදුසුකම් ලබා තිබීම. |

06. *අයදුම්කළ යුතු ක්‍රමය* :—

(අ) මෙම නිවේදනයේ අවසානයේ පළකර ඇති ආදර්ශ ආකෘතිය අනුව ඒ 4(21 සෙ.මී. x 29සෙ.මී.) ප්‍රමාණයේ කඩදාසියක දෙපැත්ත භාවිත කරමින් 1 සිට 4 දක්වා ඡේද මුල් පිටුවට ද ඇතුළත් වන පරිදි අයදුම්පත් පිළියෙල කළ යුතුය.

(ආ) අයදුම්පත් සම්පූර්ණ කළයුත්තේ විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යයෙනි.

(ඇ) නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත් 2008.08.25 දින හෝ ඊට ප්‍රථම විභාග කොමසාරිස් ජනරාල්, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, සංවිධාන හා විදේශ විභාග ශාඛාව, පැලවත්ත, බත්තරමුල්ල යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

(ඈ) අයදුම්පත් බහාලන කවරයේ වම්ත්පස ඉහළ කෙළවරේ අයදුම්කරන තනතුර පැහැදිලිව සඳහන් කළ යුතුය.

(ඉ) විභාග කොමසාරිස් ජනරාල්ගේ ආදායම් ශීර්ෂ 4000-20-03-20-13ට බැර වන ලෙස විභාග ගාස්තුව වශයෙන් එක් තනතුරක් සඳහා රුපියල් 300ක් ද, තනතුරු 02කටම අයදුම්කරන්නේ නම් රු. 450 ක් ද දිවයිනේ ඕනෑම දිස්ත්‍රික් හෝ ප්‍රාදේශීය මහලේකම් කාර්යාලයකට ගෙවා ලබාගත් මුදල් කුවිතාන්සිය අයදුම්පතේ නියමිත ස්ථානයේ ඇලවිය යුතුය. එම කුවිතාන්සියේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

(ඊ) සෑම ආකාරයකින්ම සම්පූර්ණ නොවන හා ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් පූර්ව දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලබන අතර, තැපෑලේ දී සිදුවන නැතිවීම් හා ප්‍රමාදවීම් ගැන දෙපාර්තමේන්තුව වගකියනු නොලැබේ.

(උ) රජයේ විදුහලක විදුහල්පතිවරයෙකු හෝ සමාදාන විනිශ්වයකාරවරයකු හෝ නීතිඥයකු හෝ රජයේ සේවයේ මාණ්ඩලික තනතුරක් දරන නිලධාරියෙකු විසින් අයදුම්පත්‍රයේ අපේක්ෂක/අපේක්ෂිකාවගේ අත්සන සහතික කළ යුතුය.

(ඌ) දැනටමත් රජයේ සේවයේ නියුක්තවූවන් තම ආයතන ප්‍රධානියා මගින් මෙම අයදුම්පත ඉදිරිපත් කළ යුතුය.

07. *විභාග පරිපාටිය* :—

(අ) ප්‍රවේශ පත්‍ර.— අයදුම්පත්‍ර එවා ඇති අපේක්ෂක/අපේක්ෂිකාවන්ට විභාග කොමසාරිස් ජනරාල් විසින් ප්‍රවේශපත්‍ර නිකුත් කරනු ඇත. අපේක්ෂකයකුට තමාට නියමිත මධ්‍යස්ථානයේ දී විභාග ශාලාධිපතිට තම අත්සන සහතික කරවාගත් ප්‍රවේශපත්‍රය ඉදිරිපත් කළ යුතුය. ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් නොකරන කිසිදු අයදුම්කරුවකුට විභාගයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ.

(ආ) මෙම විභාග 2008 නොවැම්බර් මාසයේ දී පමණ පවත්වනු ඇත. විභාග දිනට දින 07 කට කලින් ප්‍රවේශ පත්‍ර නොලබන අපේක්ෂක/අපේක්ෂිකාවන් පහත සඳහන් විස්තර නොපමාව බත්තරමුල්ල, පැලවත්ත විභාග දෙපාර්තමේන්තුවේ විභාග කොමසාරිස් ජනරාල් වෙත දන්වමින් ප්‍රවේශ පත්‍ර ඉල්ලුම්කළ යුතුය.

(i) විභාගයේ නම :

(ii) අපේක්ෂක/අපේක්ෂිකාවගේ සම්පූර්ණ නම :

(iii) ලිපිනය :

(vi) ඉල්ලුම්පත්‍රය ලියාපදිංචි කළ දිනය, ලියාපදිංචි කළ තැපැල් කාර්යාලය හා අංකය :

(v) විභාග ගාස්තු හා ගෙවූ කුවිතාන්සියේ අංකය, දිනය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලය :

(ඇ) විභාගයට පෙනී සිටීම වෙනුවෙන් අපේක්ෂක/අපේක්ෂිකාවන්ට දැරීමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් කිසිදු දීමනාවක් ගෙවනු නොලැබේ.

(ඈ) අනන්‍යතාව .— තමා පෙනී සිටින සෑම විෂයයක් සම්බන්ධයෙන් විභාග ශාලාධිපති සෑහීමට පත්වන අයුරින් අපේක්ෂකයකු විභාග ශාලාවේදී තමා අනන්‍යතාව ඔප්පු කළ යුතුය. මේ සඳහා

(i) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව නිකුත් කළ ජාතික හැඳුනුම්පත, හෝ

(ii) වලංගු විදේශ ගමන් බලපත්‍රය පිළිගැනේ.

තම අනන්‍යතාව තහවුරු කිරීමට ලියවිලි ඉදිරිපත් කිරීමට අපොහොසත්වන අයදුම්කරුවන්ට විභාගයට පෙනී සිටීමට ඉඩදෙනු නොලැබේ.

(ඉ) *විෂයය නිර්දේශය* :

(i) බුද්ධි පරීක්ෂණය (විෂයය අංක 01) (කාලය පැය 1යි මුළු ලකුණු 100යි) අපේක්ෂකයාගේ සිතීමේ තර්කානුකූලතාවයත්, ඔහුගේ සිතීමේ විශ්ලේෂණ තත්ත්වයත්, තීරණය කිරීමේ ශක්තියත් විනිශ්වය කිරීම සඳහා වූ වාස්තවික ප්‍රශ්නවලින් යුක්තය.

(ii) තාක්ෂණ ප්‍රශ්න පත්‍රය (ව්‍යාප්ති නිලධාරි) (විෂයය අංක 02) (කාලය පැය 02යි මුළු ලකුණු 100යි)

(iii) තාක්‍ෂණ ප්‍රශ්න පත්‍රය (පර්යේෂණ සහකාර) (විෂයය අංක 03) (කාලය පැය 02යි. මුළු ලකුණු 100යි)

| තනතුර | තාක්‍ෂණ ප්‍රශ්න පත්‍රයේ විෂය නිර්දේශය |
|---|---|
| *ව්‍යාප්ති නිලධාරි* | *තාක්‍ෂණික ප්‍රශ්න පත්‍රය*<br><br>1. සාමාන්‍ය කෘෂිකර්මය හා මූලධර්ම<br>2. භෝග නිෂ්පාදනය හා මූලධර්ම ශෂ්‍ය විද්‍යාත්මක කරුණු<br>3. පස හා පොහොර ශාක පෝෂණය පාරිසරික බලපෑම්<br>4. භෝග ප්‍රචාරණ ක්‍රම<br>5. රෝග හා පළිබෝධ කාරකයන්, ලක්ෂණ හා හානි<br>6. කෘෂිකාර්මික ප්‍රතිපත්ති, අතීත, වර්තමාන හා අනාගත විභවයන්<br>7. අපනයන කෘෂිකර්ම භෝග ගම්මිරිස්, කුරුඳු, කෝපි, කොකෝවා, කරඳමුංගු, කරාබු, සාදික්කා, බුලත් පුවක් වලට අදාළ උද්භිද විද්‍යාත්මක කරුණු, දේශගුණික සාධක, පොහොර බලපෑම හා පෝෂණය, රෝග හා පළිබෝධ, පසු අස්වනු තාක්ෂණය.<br>8. අපනයන භෝග නිෂ්පාදන අලෙවි හා අපනයන විභවයන්<br>9. කාබනික ගොවිතැන<br>10. ගොවිපල පාලනය පැළ හා රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය හා තවාන් පාලනය<br>11. කෘෂිකර්ම ව්‍යාප්ති ක්‍රම හා ව්‍යාප්ති වේදය |
| *පර්යේෂණ සහකාර* | *තාක්‍ෂණික ප්‍රශ්න පත්‍රය*<br><br>*(අ)* කෘෂිකාර්මික මූලධර්ම<br><br>1. ශ්‍රී ලංකාවේ දේශගුණික කළාප හා භෝග නිෂ්පාදනය කෙරෙහි බලපෑම<br>2. පස්වර්ග, පාංශු සංරක්‍ෂණය, ශාක පෝෂණය හා ජල සංරක්‍ෂණය<br>3. පළිබෝධ හඳුනාගැනීම, වර්ගීකරණය හා මර්ධනය<br>4. ශාක ප්‍රචාරණය, තවාන් පාලනය හා පටක රෝපණය<br>5. කෘෂිකර්මය හා පරිසරය<br>6. වතු වගාව, ක්‍ෂෙත්‍ර භෝග වගාව, මිශ්‍ර භෝග වගාව හා කෘෂි වන වගාව<br>7. පසු අස්වනු තාක්‍ෂණය<br>8. අපනයන කෘෂිකර්ම භෝග අර්ථ දැක්වීම, ප්‍රචාරණය, ක්‍ෂේත්‍ර ස්ථාපනය, නඩත්තුව, රෝග පළිබෝධ පාලනය හා අස්වනු සැකසීම<br>9. ගොවිපල පාලනය හා සැළසුම් කිරීම<br><br>*(ආ)* ශ්‍රී ලංකාවේ කෘෂිකර්මාන්ත සංවර්ධනය හා සම්බන්ධ රාජ්‍ය හා පෞද්ගලික ආයතන එකිනෙකෙහි දායකත්වය.<br><br>*(ඇ)* රසායනාගාර උපකරණ හඳුනා ගැනීම.<br><br>*ප්‍රයෝජන හා මූලික සිද්ධාන්ත*<br><br>1. රසායනාගාර වීදුරු භාණ්ඩ හඳුනා ගැනීම, ප්‍රයෝජනය හා පිරිසිදු කිරීම,<br>2. රසානියක ද්‍රව්‍ය, ආරක්ෂිතව පරිහරණය, ගබඩාකර තැබීම. |

*(ඊ)* මෙම විභාගය සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයෙන් පවත්වනු ලබන අතර, විභාගයට පෙනී සිටින සියලුම ප්‍රශ්න පත්‍ර සඳහා එකම භාෂා මාධ්‍යයකින් පෙනී සිටිය යුතුය.

*(උ)* මෙම තනතුරුවලට බඳවා ගැනීමේ තරඟ විභාගය කොළඹ දී පමණක් පැවැත්වේ.

08. *සේවා නියුක්ත කරවීමේ කොන්දේසි* :

(i) තෝරා ගනු ලබන අපේක්‍ෂක/අපේක්ෂිකාවන් දිවයිනේ කවර ප්‍රදේශයක වුවද සේවය කිරීමට බැඳී සිටිය යුතුය.

(ii) දැනට පුරප්පාඩු පවතින දිස්ත්‍රික්කයන් හා සේවා ස්ථාන පහත සඳහන් වේ.

*(අ)* පර්යේෂණ සහකාර

| | | |
|---|---|---|
| (i) | ගම්පහ දිස්ත්‍රික්කය | වල්පිට පර්යේෂණ මධ්‍යස්ථානය |
| (ii) | මාතර දිස්ත්‍රික්කය | පළොල්පිටිය කුරුඳු පර්යේෂණ මධ්‍යස්ථානය |
| (iii) | මාතලේ දිස්ත්‍රික්කය | මාතලේ පර්යේෂණ මධ්‍යස්ථානය |

*(ආ)* ව්‍යාප්ති නිලධාරි :

පහත සඳහන් දිස්ත්‍රික්ක තුළ පවතින ව්‍යාප්ති නිලධාරි කොට්ඨාසවල

(i) මොණරාගල
(ii) බදුල්ල
(iii) හම්බන්තොට
(iv) මාතර
(v) ගාල්ල
(vi) රත්නපුරය
(vii) නුවරඑළිය

09. *බඳවා ගැනීමේ ක්‍රමය.-* තරග විභාගය සඳහා නියමිත සෑම ප්‍රශ්න පත්‍රයකටම 40% ක් හෝ ඊට වැඩි ලකුණු සංඛ්‍යාවක් ලබාගත් අපේක්ෂකයින් කුසලතා අනුපිළිවෙල මත සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ. සම්මුඛ පරීක්ෂණයේ දී ලකුණු දීම සිදු නොකරන අතර, සුදුසුකම් තහවුරු කළ අයදුම්කරුවන් විභාගයේදී ලබාගත් මුළු ලකුණුවල කුසලතා අනුපිළිවෙල මත බඳවා ගැනීම් සිදු කරනු ලැබේ.

10. මෙහි පහත සඳහන් නොවන යම් කරුණක් වෙතොත්, ඒ සම්බන්ධයෙන් පත්වීම් බලධාරියා විසින් තීරණය කරනු ඇත. සියලුම අයදුම්කරුවන් මෙම *ගැසට් පත්‍රයේ* සඳහන් විභාග නීතිරීති අනුව කටයුතු කිරීමට බැඳී සිටිය යුතුය.

11. *ගැසට්* නිවේදනයේ සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත නියමිත විභාග ගාස්තු ගෙවා නියමිත දිනට හෝ එදිනට පෙර ඉල්ලුම්පත්‍ර ඉදිරිපත් කර ඇති සියලුම අයදුම්කරුවන්ට තරග විභාගයට පෙනී සිටීමට විභාග කොමසාරිස් ජනරාල් විසින් ඉඩදෙනු ලැබේ.

ඩබ්. ඩී. එල්. ගුණරත්න,
අපනයන කෘෂිකර්ම අධ්‍යක්ෂ *(වැ.බ.)*

(කාර්යාල ප්‍රයෝජනය සඳහා)

*ආදර්ශ අයදුම්පත්‍රය*

**අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ශ්‍රී ලංකා තාක්ෂණ සේවාවේ පුරප්පාඩු සඳහා බඳවා ගැනීමේ තරග විභාගය - 2008**

**Application for Competitive Examination for Recruitment to vacancies in the Sri Lanka Technological Service in the Department of Export Agriculture**

විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය : සිංහල 2
දෙමළ 3
ඉංග්‍රීසි 4

(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

ඉල්ලුම් කරන තනතුර :

(අදාළ අංකය කොටුවේ ලියන්න)

| | | |
|---|---|---|
| ව්‍යාප්ති නිලධාරි | - | 1 |
| පර්යේෂණ සහකාර | - | 2 |
| තනතුරු 02 කම සඳහා | - | 3 |

01. නම :-

1.1 මුලකුරු අගට යොදා මුලකුරු සමග නම :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන් ) උදා :-SILVA. A.B.

1.2 සම්පූර්ණ නම :————.
(සිංහලෙන්/දෙමළෙන්)

02. ස්ථිර ලිපිනය :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

2.1 ප්‍රවේශ පත්‍ර එවිය යුතු ලිපිනය :——————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

03. ස්ත්‍රී/පුරුෂ භාවය : ස්ත්‍රී 1 පුරුෂ 0 [ ]
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

3.1 උපන් දිනය: වර්ෂය [ | | | ] මාසය [ | ] දිනය [ | ]

3.2 ඉල්ලුම්පත්‍ර භාරගන්නා අවසාන දිනට වයස :- අවුරුදු : [ | ] මාස [ | ] දින [ | ]

04. විවාහක/අවිවාහක බව :
විවාහක - 2 අවිවාහක -1 [ ]
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

05. ජාතික හැඳුනුම්පත් අංකය : [ | | | | | | | | | ]

06. අධ්‍යාපන සුදුසුකම් :

*(අ)* අධ්‍යයන පොදු සහතික පත්‍ර (සා.පෙළ) විභාගය :-

| | *පළමු වතාව* | *දෙවන වතාව* |
|---|---|---|
| විභාගයේ නම | :————. | :————. |
| වර්ෂය හා මාසය | :————. | :————. |
| විභාග අංකය | :————. | :————. |
| භාෂා මාධ්‍යය | :————. | :————. |

| | *පළමු වතාව* | | | *දෙවන වතාව* | |
|---|---|---|---|---|---|
| | *විෂයය* | *සාමාර්ථය* | | *විෂයය* | *සාමාර්ථය* |
| 1. | ——————. | ——————. | 1. | ——————. | ——————. |
| 2. | ——————. | ——————. | 2. | ——————. | ——————. |
| 3. | ——————. | ——————. | 3. | ——————. | ——————. |
| 4. | ——————. | ——————. | 4. | ——————. | ——————. |
| 5. | ——————. | ——————. | 5. | ——————. | ——————. |
| 6. | ——————. | ——————. | 6. | ——————. | ——————. |
| 7. | ——————. | ——————. | 7. | ——————. | ——————. |
| 8. | ——————. | ——————. | 8. | ——————. | ——————. |

*(ආ)* අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය :-

වර්ෂය හා මාසය :——————.
විභාග අංකය :——————.
භාෂා මාධ්‍යය :——————.

| | *විෂයය* | *සාමාර්ථය* |
|---|---|---|
| 1. | ——————. | ——————. |
| 2. | ——————. | ——————. |
| 3. | ——————. | ——————. |
| 4. | ——————. | ——————. |

*(ඇ)* *වෘත්තීය සුදුසුකම්.-*

| *ඩිප්ලෝමාව සහ ආයතනයේ නම* | *සමත්වූ වර්ෂය* | *විභාග අංකය* | *සමත් විෂයයන්* | *සාමාර්ථය* |
|---|---|---|---|---|
| | | | | |

07. *(අ)* විභාග ගාස්තු ගෙවන ලද කුවිතාන්සියේ අංකය :——————.
දිනය :——————.
මුදල් ගෙවූ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය :——————.
ගෙවන ලද මුදල :——————.

විභාග ගාස්තු ගෙවන ලද කුවිතාන්සිය නොගැලවෙනසේ මෙහි අලවන්න.
(කුවිතාන්සියේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

08. *අයදුම්කරුගේ සහතිකය ඃ*

මෙම ඉල්ලුම්පත්‍රයේ මා විසින් සපයන ලද තොරතුරු සත්‍ය වූත්, නිවැරදි වූත්, ඒවා බවට මෙයින් සහතික කරමි. මෙහි ඇතුළත් තොරතුරුවලින් කිසිවක් අසත්‍ය හෝ වැරදි ඒවා බව හෝ මා තෝරා ගැනීමට පෙර දැනගතහොත්, මා නුසුදුස්සෙකු වීමට යටත් වන බවත්, පත් කිරීමෙන් පසු ඒ බව අනාවරණය වුවහොත් මට කිසිදු වන්දියක් නොගෙවා මා සේවයෙන් පහකිරීමට යටත් වන බවත් මම දැන සිටිමි.

තව ද මෙම විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීති රීති වලට මම එකඟ වෙමි.

——————,
අයදුම්කරුගේ අත්සන

දිනය : ——————.

09. *අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :*

මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන ------------.යන අය මා පෞද්ගලිකව දන්නා හඳුනන බව ද, ඔහු/ඇය මා ඉදිරිපිටදී -----------.දින ඔහුගේ /ඇයගේ අත්සන තැබූ බව ද සහතික කරමි.

——————,
අත්සන සහතික කරන නිලධාරියාගේ අත්සන

දිනය : ——————

සහතික කරන නිලධාරියාගේ සම්පූර්ණ නම : ——————

තනතුර : ——————

ලිපිනය : ——————
(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න)

විභාග කොමසාරිස් ජනරාල්,

ඉහත විස්තර දැක්වෙන අපේක්ෂකයාට/අපේක්ෂිකාවට මෙම විභාගය සඳහා පෙනී සිටීමට සුදුසුකම් ඇති/නැති බව මම සහතික කරමි.

——————,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන හා පදවි නාමය

දිනය : ——————,

07-635

### අධ්‍යාපන අමාත්‍යාංශය

### ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ 2 වන පන්තියේ II වන ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය - 2008

ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ 2-11 වන ශ්‍රේණියේ නිලධාරීන්ගේ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය 2008 නොවැම්බර් මස කොළඹ දී පැවැත්වේ. සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් විභාගය පවත්වනු ලබන අතර ඉල්ලුම් කරන භාෂා මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

02. මෙම පරීක්ෂණයට අදාළ විෂය නිර්දේශය හා අනෙකුත් විධි විධාන, අංක 1070/13-1999 මාර්තු මස 11 වන දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළකර ඇත. පහසුව සඳහා එම විෂය නිර්දේශය සහ අනිකුත් විධි විධාන පහත දක්වා ඇත.

නිලධාරියෙකුට මෙම කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයට නියමිත විෂයන් සඳහා එකම වතාවක දී හෝ වෙන වෙනම අවස්ථාවල දී හෝ පෙනී සිටිය හැක.

*විෂයය නිර්දේශය* :

| *විෂයය අංකය* | *විෂයය* | *ලකුණු* | *කාලය* |
|---|---|---|---|
| (01) | සාමාන්‍ය කළමනාකරණය හා ආයතන කටයුතු<br>රජයේ ආයතන සංග්‍රහයේ i, ii, iii, iv, v, vii, viii, ix, xii, xiii, xiv, xxiv, xxviii, xxx, හා xxxi යන පරිච්ඡේදයන්ට විශේෂ අවධානය ඇතිව ආයතන සංග්‍රහයේ නීති | 100 යි. | පැය 1 1/2 යි. |
| (02) | මුදල් රෙගුලාසි<br>රජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ i වැනි කොටසේ i, ii, v, viii, xii හා xiv පරිච්ඡේදයන්ට විශේෂ අවධානය ඇතිව, | 100 යි | පැය 1 1/2 යි. |
| (03) | අධ්‍යාපන නීතිය<br>අපේක්ෂකයින්ගෙන් පහත සඳහන් ආඥාපනත් හා පාර්ලිමේන්තු පනත් පිළිබඳව දැනුමක් අපේක්ෂා කෙරේ. | 100 යි | පැය 2 යි. |

i. 1939 අංක 31 දරන අධ්‍යාපන ආඥාපනත හා ඒ යටතේ පනවන ලද රෙගුලාසි,

ii. 1960 අංක 5 දරන උපකෘත පාඨශාලා හා ගුරු විද්‍යාල (විශේෂ විධිවිධාන) පනත,

iii. 1961 අංක 8 දරන උපකෘත පාඨශාලා හා ගුරු විද්‍යාල (පරිපූරක විධිවිධාන) පනත,

iv. 1976 අංක 15 දරන ප්‍රසිද්ධ විභාග (සංශෝධන) පනතින් සංශෝධිත 1968 අංක 25 දරන ප්‍රසිද්ධ විභාග පනත,

v. 1981 අංක 65 දරන උපකෘත පාඨශාලා (විශේෂ විධිවිධාන) පනත,

vi. 1985 අංක 28 දරන ජාතික අධ්‍යාපන ආයතන පනත,

vii. 1986 අංක 30 දරන අධ්‍යාපනික විද්‍යායතන පනත,

viii. 1991 අංක 19 දරන ජාතික අධ්‍යාපන කොමිෂන් සභා පනත,

ix. 1997 අංක 32 දරන ජාතික ගුරු අධ්‍යාපන අධිකාර්ය පනත

x. 13 වන සංශෝධනයට හා මූලික අයිතිවාසිකම් පිළිබඳ 3 වැනි පරිච්ඡේදයට විශේෂ අවධානය ඇතිව ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව,

xi. අධ්‍යාපනයට අදාළ පළාත් සභා විසින් පනවා ඇති ප්‍රඥප්ති.

*සැ. යු.*-අපේක්ෂකයින් විසින් කාර්යක්ෂමතා පරීක්ෂණය සමත්වීම සඳහා එක් එක් ප්‍රශ්න පත්‍රයක් සඳහා යටත් පිරිසෙයින් 40%ක ලකුණු ප්‍රමාණයක් ලබාගත යුතුය.

03. *විභාගයේ භාෂා මාධ්‍යය* :

i. අපේක්ෂකයින්ට රාජ්‍ය භාෂාව හෝ ජාතික භාෂාව හෝ යන එකකින් පිළිතුරු ලිවිය හැකිය.

ii. අපේක්ෂකයා රාජ්‍ය සේවයට ඇතුළුවීමට පෙර පෙනී සිටි තරග විභාගයේ භාෂා මාධ්‍ය හෝ තරග විභාගයක් නොමැතිව රජයේ සේවයට බැඳුණු අය සම්බන්ධයෙන් රජයේ සේවයට ඇතුළුවීමට සුදුසුකම් ලැබූ විභාගයට පෙනී සිටි භාෂා මාධ්‍යයෙන් පිළිතුරු ලිවිය හැක.

04. අපේක්ෂකයකු තමාට හිමිකම් නොමැති මාධ්‍යයකින් විභාගයට පෙනී සිටින බැව් හෙළිවුවහොත් ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ.

05. ඉල්ලුම් පත්‍රය පහත දැක්වෙන ආකෘති පත්‍රයට අනුව සකසා ඉදිරිපත් කළයුතුය. ඉල්ලුම් පත්‍රයේ සියලුම ශීර්ෂයන් පළමුවන පිටුවට වන ලෙස ගෙන සකස් කළ යුතු අතර ඊට අදාල තොරතුරු තම අත් අකුරින්ම පැහැදිලිව සඳහන් කළ යුතුය. ආදර්ශ ඉල්ලුම් පත්‍රයට අනුකූල නොවන ඉල්ලුම් පත්‍ර, අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති ඉල්ලුම් පත්‍ර දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඉල්ලුම් පත්‍රයේ ඡායා පිටපතක් ලඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වන අතර සම්පූර්ණ කරනු ලබන ඉල්ලුම් පත්‍රය විභාග නිවේදනයේ සඳහන් ආදර්ශ අයදුම් පත්‍රයට අනුකූල ද යන්න පිළිබඳව අයදුම්කරු විසින් විමසා බැලිය යුතු අතර එසේ නොවුනහොත් අයදුම්පත ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඉල්ලුම් පත්‍රය පිළියෙල කිරීමේ දී එහි ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල ඉල්ලුම් පත්‍රවල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන් ද, දෙමළ අයදුම්පත්‍රවල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන් ද, සඳහන් කළ යුතුය.

06. මෙම පරීක්ෂණය විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලබන අතර, විභාග පැවැත්වීම සඳහා ඔහු විසින් පනවා ඇති නීති රීති පිළිපැදීමට අපේක්ෂකයෝ බැඳී සිටිති.

07. ඉල්ලුම් පත්‍ර **2008.08.29** වැනි දින හෝ ඊට පෙර "විභාග කොමසාරිස් ජනරාල්, සංවිධාන හා විදේශ විභාග ශාඛාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, පැලවත්ත, බත්තරමුල්ල" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. මෙදිනට පසුව එවනු ලබන කවර හෝ ඉල්ලුම් පත්‍රයක් වුව ද ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඉල්ලුම් පත්‍රය බහා එවන කවරයේ වමත් පස ඉහළ කෙළවරේ "ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ 2-11 කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය" යනුවෙන් සඳහන් කර එවිය යුතුය.

08. යම් අපේක්ෂකයකුට විභාගයට යටත් පිරිසෙයින් දින 07කට කලින් තමාගේ ප්‍රවේශ පත්‍රය නොලැබුණහොත් ඔහු විසින් ඒ බව අප්‍රමාදව

බත්තරමුල්ල, පැලවත්ත, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ විභාග කොමසාරිස් ජනරාල්ට දැනුම් දිය යුතුය. (විදුලි පණිවුඩ යවන ලිපිනය - විභාග කොමසාරිස් ජනරාල්, සංවිධාන හා විදේශ විභාග ශාඛාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, පැලවත්ත, බත්තරමුල්ල වේ. ප්‍රවේශ පත්‍රය නොලැබුණ බව විභාග කොමසාරිස් ජනරාල්ට දැනුම් දෙන අතරම, පහත දැක්වෙන තොරතුරු ද සැපයිය යුතුය.) අයදුම්කරුවන් වෙත ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් පුවත් පත් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පළ කරනු ඇත. නිවේදනය පළ වී දින 2ක් හෝ 3ක් ගත වූ පසුවත් ප්‍රවේශ පත්‍රය නොලැබුණි නම් දැන්වීමේ සඳහන් ආකාරයට ඒ බව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දන්වා සිටිය යුතු යි. ඔබ වෙත තබා ගත් අයදුම්පත්‍රයේ හා මුදල් ගෙවූ කුවිතාන්සියේ සහතික කළ ඡායා පිටපත් ද, ලියාපදිංචි කළ කුවිතාන්සිය ද, කොළඹින් බැහැර ප්‍රදේශයක නම් ප්‍රවේශ පත්‍රය එවීම සඳහා ෆැක්ස් අංකයක් ද සඳහන් ඔබගේ ඉල්ලීම් ලිපිය ද ළඟ තබා ගෙන ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දැන්වීම වඩාත් ඵලදායී වනු ඇත.

i. විභාගයේ නම :—————.
ii. අපේක්ෂකයාගේ සම්පූර්ණ නම :—————.
iii. අපේක්ෂකයාගේ සම්පූර්ණ ලිපිනය :—————.
iv. ඉල්ලුම් පත්‍රය තැපැල් කළ දිනය :—————.
(ලියාපදිංචි කළ අංකය සහ තැපැල් කාර්යාලය)
"නුදුරුව සිටින අයට පණිවුඩකරුවකු මගින් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ සංවිධාන හා විභාග ශාඛාවට (E-Block) දැනුම් දීම ද කළ හැකිය".

09. ඉහත 08 වැනි ඡේදයේ සඳහන් කර ඇති අවශ්‍යතාවන් සපුරාලීමට අපොහොසත් වන අපේක්ෂකයින් විසින් පසුව ඉදිරිපත් කෙරෙන පැමිණිලි සළකා බලනු නොලැබේ.

10. විභාග ශාලාවේ දී තමන්ගේ අනන්‍යතාව තහවුරු කිරීම සඳහා සාක්ෂි ඉදිරිපත් කිරීම අපේක්ෂකයින්ගේ වගකීම වන අතර, ඒ සඳහා පහත සඳහන් ලියවිලි අතුරින් කුමක් වුවත් වලංගු වේ.

(i) පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ කොමසාරිස් විසින් නිකුත්කරන ලද ජාතික හැඳුනුම්පත,

(ii) වලංගු විදේශ ගමන් බලපත්‍රය.

11. මෙම විභාගයට පෙනී සිටින අපේක්ෂකයින්ගෙන් පහත සඳහන් පදනම මත විභාග ගාස්තු අය කිරීමට තීරණය කර ඇත.

*(අ)* පළමු වතාවට විභාගයට පෙනී සිටින අයගෙන් සම්පූර්ණ විභාගය හෝ කොටසක් සඳහා ගාස්තු අය නොකෙරේ.

*(ආ)* සම්පූර්ණ විභාග ගාස්තු රු. 150 කි.
එක් විෂයකට රු. 50 කි.

අපේක්ෂකයන් විසින් අත්සන් තබා නිසි පරිදි අවලංගු කිරීමෙන් ආදායම් මුද්දර මගින් ගාස්තු ගෙවිය යුතුය.

එම්. එම්. එන්. ඩී. බණ්ඩාර,
ලේකම්,
අධ්‍යාපන අමාත්‍යාංශය.

2008 ජූලි 01 වැනි දින,
අධ්‍යාපන අමාත්‍යාංශය,
ඉසුරුපාය,
බත්තරමුල්ල.

*ඉල්ලුම්පත්‍රය*

**ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ 2 පන්තියේ II ශ්‍රේණියේ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය - 2008**

## Efficiency Bar Examination in Class 2 Grade II of Sri Lanka Teacher Educators' Service - 2008

ඉල්ලුම් පත්‍ර, විභාග කොමසාරිස් ජනරාල්, සංවිධාන හා විදේශ විභාග ශාඛාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, පැලවත්ත, බත්තරමුල්ල යන ලිපිනය වෙත ආයතන ප්‍රධානියා මාර්ගයෙන් ලියාපදිංචි තැපෑලෙන් ඉදිරිපත් කළ යුතුය.
*(විභාගයේ නම, කවරයේ වමත්පස ඉහළ කෙළවරේ දැක්විය යුතුය.)*

නිලධාරියා විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය : සිංහල - 2 ☐
දෙමළ - 3
ඉංග්‍රීසි - 4
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

1. *(අ)* මුලකුරු අගට යොදා මුලකුරු සමග නම :—————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරින්) උදා. :-SILVA. A.B. (Mr/Mrs/Miss)
*(ආ)* මුලකුරුවලින් හැඳින්වෙන නම් :—————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරින්)
2. උපන් දිනය : වර්ෂය ☐☐☐☐ මාසය ☐☐ දිනය ☐☐
3. i. පදවි නාමය :—————.
ii. සේවය කරන විද්‍යාපීඨය/ගුරු විද්‍යාලය/ ගුරු මධ්‍යස්ථානය හා ලිපිනය (ප්‍රවේශ පත්‍ර මෙම ලිපිනයට එවනු ලැබේ.) :—————.
4. පෞද්ගලික ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :—————.
5. නිවේදනයේ 3 ඡේදයේ (අ) යටතේ දක්වා ඇති විෂය අංකය හා විෂය සහිතව ගන්නා විෂයයන් පැහැදිළිව සඳහන් කළ යුතුය.

| *විෂය අංකය* | *විෂයයේ නම* |
|---|---|
| | |
| | |
| | |

6. මීට ප්‍රථම විභාගයට සම්පූර්ණ ලෙස හෝ ඉන් කොටසකට හෝ පෙනී සිටියේ ද, එසේ නම් විෂයයන් හා පෙනී සිටි වර්ෂය හා මාධ්‍යය සඳහන් කරන්න.

| *විෂයය* | *වර්ෂය* | *මාධ්‍යය* |
|---|---|---|
| ........................... | ........................... | ........................... |
| ........................... | ........................... | ........................... |

7. ගෙවන ලද විභාග ගාස්තු :

| මුද්දර මෙහි අලවන්න. |
|---|

(නියමිත ගාස්තු සඳහා මුද්දර අලවා ඒ මත අයදුම්කරුගේ අත්සන තබා අවලංගු කරන්න.)

8. ඉහත දැක්වෙන විස්තර නිවැරදි බවත්, ගැසට් නිවේදනයේ 03 වැනි ඡේදයේ දක්වා ඇති භාෂා මාධ්‍යයෙන් මෙම විභාගයට පෙනී සිටීමට

මට හිමිකම් ඇති බවත් ප්‍රකාශ කරමි. තවද විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීති වලට මෙම එකඟ වෙමි.

——————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :——————.

විභාග කොමසාරිස් ජනරාල්,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව,

ඉදිරිපත් කරමි.

මෙම විස්තර දැක්වෙන අපේක්ෂකයාට/අපේක්ෂිකාවට මෙම විභාගයට පෙනී සිටීමට සුදුසුකම් ඇති බවත්, *ගැසට් නිවේදනයේ* 03 වැනි ඡේදයට අනුව ඔහු/ඇය විසින් දක්වා ඇති භාෂා මාධ්‍යයෙන් මෙම විභාගයට පෙනී සිටීමට ඔහුට/ඇයට සුදුසුකම් ඇති බවත්, මම සහතික කරමි.

02. අපේක්ෂකයා/අපේක්ෂිකාව මුද්දර/මුද්දරය නිසි පරිදි අවලංගු කර ඇති බව සහතික කරමි.

——————,
පීඨාධිපතිගේ/ගුරු මධ්‍යස්ථානාධිපතිගේ
අත්සන හා පදවි නාමය

දිනය :——————.

07-565

---

**පරිසර හා ස්වාභාවික සම්පත් අමාත්‍යාංශය**

වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව

ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ පුහුණු කිරීමේ ශ්‍රේණියේ අඩවි වන නිලධාරි තනතුරු වලට බඳවා ගැනීම - 2008

වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ, ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ පුහුණු කිරීමේ ශ්‍රේණියේ අඩවි වන නිලධාරි තනතුරු සඳහා සුදුසුකම් ඇති ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

2. *වැටුප් ක්‍රමය.-*

i. පුහුණු කිරීමේ ශ්‍රේණිය : MN: 1-2006 A රා. පරි. ච. ලේඛ 06/2006 (IV) අනුව, රු. 13,120-145 x 1–රු. 13,265
ii. II ආ පන්තිය : MN: 3:2006 A (රා. පරි. ච. ලේඛ අංක 07/2008 අනුව) රු. 15,005-180x4-240x6-රු. 17,165

3. සේවයේ අනුයුක්ත කරවීමේ පොදු නියමයන් හා සේවා කොන්දේසි :

i. මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් ගෙවිය යුතුය.

ii. පත්වීම අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වේ.

iii. බඳවා ගනු ලබන්නේ පුහුණු කිරීමේ ශ්‍රේණියටය.

iv. අඩවි වන නිලධාරීන්ගේ සේවා ස්ථාන දිවයිනේ වනගත ප්‍රදේශවල පිහිටි, දුෂ්කර සේවා ස්ථාන වන අතර, තෝරාගනු ලබන අපේක්ෂකයින් දිවයිනේ නියෝග කරනු ලබන ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට සූදානම්ව සිටිය යුතු වේ.

v. ශ්‍රී ලංකා තාක්ෂණ සේවාව පිළිබඳ ව්‍යවස්ථා සංග්‍රහයේ සහ ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ අඩවි වන නිලධාරීන් බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටියේ (සංශෝධිත) වගන්ති අදාළ වනු ඇත.

vi. *ගැසට් පත්‍රයේ* (IIඅ) ඡේදයේ ආරම්භයේ පළ කර ඇති රාජ්‍ය සේවයේ තනතුරුවලට පත් කිරීමේ දී අදාළ වන පොදු කොන්දේසි අදාළ වේ.

vii. විභාගය පැවැත්වෙන්නේ සිංහල සහ දෙමළ මාධ්‍යයෙන් පමණි.

4. *වයස් සීමාව.–* ඉල්ලුම්පත් භාර ගන්නා අවසාන දිනට අවුරුදු 18ට නොඅඩු සහ අවුරුදු 45ට නොවැඩි විය යුතුය. දැනටමත් රාජ්‍ය සේවයේ හා පළාත් රාජ්‍ය සේවයේ අනුයුක්ත වූවන්ට උපරිම වයස් සීමාව අදාළ නොවනු ඇත.

5. *අධ්‍යාපන හා වෙනත් සුදුසුකම්.-* 5.01 සෑම අයදුම්කරුවෙකුම පහත සඳහන් සුදුසුකම් සතුටුදායක ලෙස සම්පූර්ණ කර තිබිය යුතුය.

i. සත්ත්ව විද්‍යාව, උද්භිද විද්‍යාව, කෘෂි විද්‍යාව යන විෂයයන් අතරින් විෂයයන් දෙකක් ඇතුළත්ව විෂයයන් තුනකින් (03) අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය එකවර සමත් වී තිබිය යුතුය.

*හෝ*

අධ්‍යාපන නව විභාග පරිපාටිය යටතේ ජීව විද්‍යාව හෝ කෘෂි විද්‍යාව සහිතව විෂයයන් තුනකින් අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය එකවර සමත්ව තිබිය යුතුය.

*හා*

ii. භාෂාව හෝ සාහිත්‍ය, අංක ගණිතය/ගණිතය, විද්‍යාව සහ තවත් එක් විෂයයකට සම්මාන සහිතව විෂයන් හයකින් අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය දෙවරකට නොවැඩි වාර ගණනකදී සමත් වී තිබිය යුතුය.

iii. පිරිමි අයදුම්කරුවන් සඳහා අවම උස ප්‍රමාණය අඩි 05 අඟල් 02ද, පපුව අඟල් 32ක් ද විය යුතු අතර, කාන්තා අයදුම්කරුවන් සඳහා අවම උස අඩි 05ක් විය යුතුය. (පපුවේ ප්‍රමාණය කාන්තා අයදුම්කරුවන් සඳහා අදාළ නොවේ.)

iv. අයදුම්කරුවන් මනා චරිතයකින් යුක්ත විය යුතුය.

*6. බඳවා ගැනීමේ ක්‍රමය.-*

i. ඉහත 05:01 ඡේදය යටතේ සුදුසුකම් ලබන අයදුම්කරුවන්, විභාග දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන ලිඛිත පරීක්ෂණයකින් ලබා ගන්නා ලකුණුවල ප්‍රමුඛතාවයේ අනුපිළිවෙල මත, සම්මුඛ පරීක්ෂණයකට ලක් කිරීමෙන් පසු, පවත්නා/නියමිත පුරප්පාඩු සංඛ්‍යාවට අනුරූපී ලෙස තෝරාගනු ලැබේ. (සම්මුඛ පරීක්ෂණය සඳහා අයදුම්කරුවන්ට ලකුණු ලබා දෙනු නොලැබේ.)

ii. ඉහත 6.i යටතේ සුදුසුකම් මත තෝරාගනු ලබන අපේක්ෂකයින්, සේවක සංඛ්‍යාවෙන් පිටත පවතින පුහුණු කිරීමේ ශ්‍රේණියට ඇතුළත් කරන අතර, අදාළ විෂයය නිර්දේශය අනුව වන විද්‍යායතනයේ දී ලබා ගන්නා වසර දෙකක න්‍යායාත්මක හා ප්‍රායෝගික පුහුණුව සාර්ථකව නිම කොට විභාගය සමත් වීමෙන් අනතුරුව, ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ II පන්තියේ ආ බණ්ඩයට ඇතුළත් කෙරේ.

iii. ඉහත 6.i යටතේ සුදුසුකම් මත තෝරාගනු ලබන අපේක්ෂකයින් අතරින්, රජයේ පිළිගත් කාර්මික විද්‍යාලයක ක්ෂේත්‍රයට අදාළ, ජාතික තාක්ෂණ සහතිකය (තුන් අවුරුදු අර්ධ කාලීන පුහුණු පාඨමාලාව) ලබා ඇති අයදුම්කරුවන්, නුවරඑළිය වන විද්‍යායතනයේ එක් වසරක න්‍යායාත්මක හා ප්‍රායෝගික පුහුණුව සාර්ථකව නිම කොට අදාළ විභාගය සමත් වීමෙන් පසු, II පන්තියේ ආ බණ්ඩයට පත්කරනු ලැබේ.

iv. ඉහත 6.i යටතේ සුදුසුකම් මත තෝරාගනු ලබන අපේක්ෂකයින් අතරින්, රජයේ අනුමත ආයතනයක් විසින් පිරිනමනු ලබන දෑවුරුදු කෘෂිකර්ම ඩිප්ලෝමා පාඨමාලාව සමත් වී අදාළ සහතික ලබා ඇති අයදුම්කරුවන්, ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ II ආ බණ්ඩයට බඳවා ගනු ලැබේ.

v. ඉහත 6.i සහ 6.iv යටතේ සුදුසුකම් මත තෝරාගනු ලබන අපේක්ෂකයින් සේවයට බැඳී වසර 05ක් ඇතුළත, ශ්‍රී ලංකා වන විද්‍යායතනයේ දෙවසරක න්‍යායාත්මක හා ප්‍රායෝගික පුහුණුව සාර්ථකව නිම කොට අදාළ විභාගය සමත් වීම අනිවාර්ය වේ.

7. *විෂයය නිර්දේශය.*–

ලිඛිත තරග විභාගය ප්‍රශ්න පත්‍ර දෙකකින් සමන්විතය.

i. බුද්ධි පරීක්ෂණය-කාලය පැය 01. ලකුණු සංඛ්‍යාව 100 අපේක්ෂකයාගේ සිතීමේ තර්කානුකූලතාවයත්, විශ්ලේෂණ තත්ත්වයත්. තීරණ ගැනීමේ ශක්තියත් විනිශ්චය කිරීම සඳහා වූ කෙටි හා බහුවරණ ප්‍රශ්නවලින් යුක්ත ප්‍රශ්න පත්‍රයකි.

ii. තාක්ෂණ ප්‍රශ්න පත්‍රය-කාලය පැය 02. ලකුණු සංඛ්‍යාව 100

iii. මෙම ප්‍රශ්න පත්‍රය අර්ධ ව්‍යුහගත හා ව්‍යුහගත ප්‍රශ්නවලින් සමන්විතය.

*විෂයය නිර්දේශය.*–

*(a)* වන සම්පත් කළමනාකරණය සහ උපයෝගීතාවය සම්බන්ධ කාර්යයන් පිළිබඳ අවබෝධය

*(b)* ශ්‍රී ලංකාවේ පාරිසරික දැනුවත් බව, භූගෝලීය වැදගත්කම පිළිබඳ අවබෝධය

*(c)* ශ්‍රී ලංකාවේ කෘෂිකර්ම ආර්ථිකය පිළිබඳ වූ දැනුම

*(d)* පරිසර හා ස්වාභාවික සම්පත් අමාත්‍යාංශය, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව සම්බන්ධ වැදගත් තොරතුරු - එහි කාර්යයන් හා පරමාර්ථ පිළිබඳ අවබෝධය

*(e)* වන සම්පත හා පරිසරය, වනාන්තර හා වෘක්ෂලතා පිළිබඳ දැනුම

*(f)* වනාන්තර හා මහජනතාව අතර ඇති සමීප සම්බන්ධතාව හා එහි වැදගත්කම පිළිබඳ අවබෝධය

*(g)* උද්භිද විද්‍යාත්මක මූලික දැනුම හා භූගෝල විද්‍යාත්මක මූලික දැනුම

*(h)* සාමාන්‍ය දැනුම මැන බැලීම

iii. අපේක්ෂකයින් මෙකී ප්‍රශ්න පත්‍ර දෙකටම පෙනී සිටිය යුත්තේ එකම භාෂා මාධ්‍යයකිනි.

8. *අයදුම්පත් හා අනෙකුත් විස්තර.*–

i. මෙම නිවේදනයේ අවසානයේ දක්වා ඇති ආදර්ශ අයදුම්පත්‍රය අනුව සෙ. මී. 21X29 (ඒ 4 ප්‍රමාණයේ) කඩදාසිවල තමන් විසින් ඉල්ලුම්පත සකස් කළයුතු අතර, ඉල්ලුම්පත බහා එවන කවරයේ වම් පස ඉහළ කෙළවරේ, 'අඩවි වන නිලධාරී තනතුරට බඳවා ගැනීම - 2008' යනුවෙන් සඳහන් කර, 2008.08.31 දින හෝ ඊට පෙර ලැබෙන සේ, විභාග කොමසාරිස් ජනරාල්, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, සංවිධාන හා විදේශ විභාග ශාඛාව, තැ. පෙ. 1503, කොළඹ යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. (පෞද්ගලික නමකට හෝ වෙනත් කිසිදු ලිපිනයකට හෝ නොඑවිය යුතුය.)

ii. අසම්පූර්ණ හෝ ප්‍රමාද වී හෝ ලැබෙන ඉල්ලුම්පත් දැන්වීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

iii. තැපෑලේදී අස්ථානගත වන ඉල්ලුම්පත් පිළිබඳව වග කියනු නොලැබේ.

iv. ඉල්ලුම්පත්‍රයේ අයදුම්කරුගේ අත්සන රජයේ විදුහලක විදුහල්පතිවරයෙකු හෝ සාමදාන විනිශ්චයකාරවරයෙකු හෝ යුධ, නාවික, ගුවන් හමුදා අධිකාරී බලයලත් නිලධාරියෙකු හෝ පොලිස් සේවයේ ගැසට් කරන ලද තනතුරක් දරන නිලධාරියෙකු හෝ රාජ්‍ය හෝ පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරක් දරනු ලබන මාණ්ඩලික නිලධාරියෙකු හෝ තමා පදිංචි වසමේ ග්‍රාම නිලධාරිවරයා විසින් සහතික කරනු ලැබිය යුතුය.

v. මෙම නිවේදනයේ දැක්වෙන නියමයන්ට අනුකූල නොවන ඉල්ලුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

vi. රජයේ සේවයේ අනුයුක්ත නිලධාරීන් තම ඉල්ලුම්පත් ස්වකීය දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතු අතර, සුදුස්සෙකු වශයෙන් තේරී පත් වුවහොත් එම දෙපාර්තමේන්තුවේ සේවයෙන් නිදහස් කිරීමට එකඟ වන බවට සඳහන් කළ යුතුය.

vii. ඉල්ලුම්පත ලද බව දන්වනු නොලැබේ.

9. *විභාග ගාස්තු.*–

i. විභාග ගාස්තුව රු. 300.00කි. 'වන සංරක්ෂක ජනරාල්ගේ,' 'පොදු තැන්පත් ගිණුමට' බැර වන ලෙස, දිවයිනේ පිහිටි ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට ඉහත මුදල ගෙවා, ලබාගත් මුදල් බාර ගැනීමේ කුවිතාන්සිය/ලදුපත අයදුම්පත්‍රයේ නියමිත ස්ථානයේ නොගැලවෙන සේ ඇලවිය යුතුය. (එම කුවිතාන්සියේ ඡායා පිටපතක් අයදුම්කරු ළඟ තබා ගැනීම සුදුසුය.)

ii. කුමන කරුණක් යටතේ වුවද විභාග ගාස්තුව ආපසු නොගෙවන අතර, වෙනත් කිසිම විභාගයක් සඳහා මාරු කිරීමට හෝ ඉඩ දෙනු නොලැබේ.

10. පහත සඳහන් ලිපිලේඛනවලින් එකක් හෝ සියල්ලම හෝ කැඳවීමක් කළ අවස්ථාවක ඉදිරිපත් කළ යුතුය :

i. උප්පැන්න සහතිකය
ii. අධ්‍යාපන සහතික
iii. මෑතකදී ලබා ගත් ග්‍රාම සේවා සහතිකයක් (ප්‍රාදේශීය ලේකම්ගේ අනු අත්සන සහිත)

iv. චරිත සහතික දෙකක්
v. වෙනත් අදාළ සහතික

**සැළකිය යුතුයි** : ලියකියවිලි හෝ ඒවායේ පිටපත් ඉල්ලුම්පත්‍රය සමඟ නොඇමිණිය යුතුය.

11\. i. විභාගය පහත සඳහන් නගරවලදී පමණක් පැවැත්වේ.
1. කොළඹ 2. මහනුවර, 3. මාතර, 4. කුරුණෑගල, 5. රත්නපුර 6. අනුරාධපුර, 7. බදුල්ල, 8. අම්පාර, 9. මඩකලපුව, 10. ත්‍රිකුණාමලය, 11. වව්නියාව, 12. යාපනය, 13. කිලිනොච්චි, 14. මුලතිව්

ii. ඉහත සඳහන් යම්කිසි විභාග මධ්‍යස්ථානයක් සඳහා, ප්‍රමාණවත් අයදුම්කරුවන් සංඛ්‍යාවක් නොසිටින අවස්ථාවක, ඔවුන් ලඟම ඇති විභාග මධ්‍යස්ථානයක් වෙත යොමු කරනු ඇත.

iii. විභාගය පැවැත්වෙන දිනය සහ ස්ථානය යනාදි විස්තර ඇතුළත් ප්‍රවේශපත්‍රයක්, විභාගයට අවම වශයෙන් දින 07කට කලින් අයදුම්කරුවන්ට තැපැල් මගින් එවනු ලබන අතර, විභාගයට පැමිණීමේ ගමන් වියදම් හෝ වෙනත් කිසිම දීමනාවක් රජයෙන් ගෙවනු නොලැබේ. විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කරනු ලැබීම මෙම තනතුර සඳහා සුදුසුකමක් සේ කිසිසේත් නොසැළකිය යුතුය.

12\. *අපේක්ෂකයාගේ අනන්‍යතාව*.- විභාග පරීක්ෂක සෑහීමකට පත්වන අයුරින් ඉල්ලුම්කරු තම අනන්‍යතාවය ඔප්පු කළ යුතු අතර, ඒ සඳහා පහත සඳහන් ඕනෑම ලේඛනයක් පිළිගනු ඇත.

i. පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත
ii. විදේශ ගමන් බලපත්‍රය.

13\. *සාවද්‍ය තොරතුරු සැපයීමට දඬුවම*.- තෝරා ගනු ලැබීමට පෙර හෝ පසු හෝ අපේක්ෂකයෙකු අදාළ සුදුසුකම් සම්පූර්ණ කර නැති බව අනාවරණය වුවහොත්, ඕනෑම අවස්ථාවකදී ඔහුගේ අපේක්ෂකත්වය හෝ තෝරා ගැනීම අවලංගු කළ හැකි අතර, අපේක්ෂකයෙකු ඉදිරිපත් කර ඇති කිසියම් කරුණක් ඔහු එය සාවද්‍ය බව දැන දැනම ඉදිරිපත් කර ඇති බව හෝ යම් වැදගත් කරුණක් ඕනෑකමින් වෙනස් කර ඇති බව හෝ ඔහු තෝරා ගැනීමට පසුව හෙළි වුවහොත් ඔහු රාජ්‍ය සේවයෙන් පහ කිරීමට යටත් වනු ඇත.

14\. අවශ්‍ය අවස්ථාවකදී, මෙම නිවේදනයේ සඳහන් කර නොමැති කරුණු පිළිබඳව වන සංරක්ෂක ජනරාල් විසින් තීරණය කරන පරිදි කටයුතු කරනු ඇත.

වන සංරක්ෂක ජනරාල්.

2008, ජූලි මස 18 වැනි දින,
වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව,
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

**වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ පුහුණු කිරීමේ ශ්‍රේණියේ අඩවි වන නිලධාරී තනතුරු සඳහා බඳවා ගැනීම - 2008**

නගර අංකය : ☐
නගරය :——————.
නිවේදනයේ අංක 11 බලන්න.

01\. i. අයදුම්කරුගේ මුල් අකුරු සමඟ නම :——————.
(ඉංග්‍රීසියෙන්) :——————.

ii. සම්පූර්ණ නම :——————.
(ඉංග්‍රීසියෙන්) :——————.

02\. ස්ථිර ලිපිනය :——————.
(ඉංග්‍රීසියෙන්) :——————.

03\. ස්ත්‍රී/පුරුෂ භාවය : ☐
පුරුෂ - 0 ස්ත්‍රී - 1 (අදාළ අංකය කොටුව තුළ ලියන්න.)

04\. විභාගයට පෙනී සිටින මාධ්‍ය : ☐
සිංහල - S දෙමළ - T ඉංග්‍රීසි - E (අදාළ අක්ෂරය කොටුව තුළ ලියන්න)

05\. ඔබ ශ්‍රී ලංකාවේ පුරවැසියෙක් ද යන වග :
පරම්පරාවෙන් - 1 ලියාපදිංචි වීමෙන් - 2 ☐
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

06\. උපන් දිනය :——————.
2008.08.31 දිනට වයස: අවුරුදු:————. මාස:————. දින:————.

07\. ජාතික හැඳුනුම්පත් අංකය : ☐☐☐☐☐☐☐☐☐☐

08\. කායික යෝග්‍යතාවය: උස: අඩි :——————.

පපුව: අඟල් :—————. (කාන්තා අයදුම්කරුවන්ට අදාළ නොවේ.)

09\. අධ්‍යාපන සුදුසුකම් :

I. අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ විභාගය)
1 වන වර 2 වන වර

*වර්ෂය* :———.*විභාග අංකය* :———.*වර්ෂය* :———. *විභාග අංකය* :———.

| *විෂයය* | *ශ්‍රේණිය* |
|---|---|
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |

| *විෂයය* | *ශ්‍රේණිය* |
|---|---|
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |

II. අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ විභාගය)
වර්ෂය :—————. විභාග අංකය :—————.

| *විෂයය* | *ශ්‍රේණිය* |
|---|---|
| | |
| | |
| | |
| | |

10\. වෙනත් අධ්‍යාපන සුදුසුකම් :—————.

11\. වෘත්තීය/වෙනත් සුදුසුකම් :—————.

12\. i. විභාග ගාස්තු ගෙවූ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය :—————.
ii. ලදුපතේ අංකය හා දිනය :—————.

කුවිතාන්සිය නොගැලවෙන පරිදි මෙහි අලවන්න.

13. i. ඔබ කවරදාක හෝ කවර හෝ චෝදනාවක් සඳහා උසාවියකින් දඬුවම් ලබා තිබේද? ඔව්/නැත. :——————.

ii. ඔව් නම් විස්තර සඳහන් කරන්න. :——————.

14. ඔබ දැනට රැකියාවක් කරන්නේ නම්, ඒ පිළිබඳ විස්තර

තනතුර :——————. ආයතනය :——————.

මුල් පත්වීම් දිනය :——————. වැටුප :——————.

15. ඔබ ගැන තොරතුරු සැපයිය හැකි ඥාතීන් නොවන දෙදෙනෙකුගේ නම් සහ ලිපිනයන් සඳහන් කරන්න.

i. :——————.
ii. :——————.

16. *අයදුම්කරුගේ ප්‍රකාශය :*

මෙම අයදුම්පතේ මවිසින් සපයන ලද තොරතුරු සත්‍ය ඒවා බවට ද, නිවැරදි ඒවා බවටද මම සහතික කරමි. මෙහි ඇතුළත් වූ තොරතුරුවලින් කිසිවක් අසත්‍ය හෝ වැරදි බව මා තෝරා ගැනීමට පෙර අනාවරණය වුවහොත් මගේ අයදුම්පත් අවලංගු වීමට යටත් බව හා පත්වීම ලැබීමෙන් පසු එසේ ඔප්පු වුවහොත් වන්දියක් නොමැතිව සේවයෙන් පහ කරනු ලැබීමට යටත් වන බව ද මම දනිමි.

——————,
අයදුම්කරුගේ අත්සන.

දිනය : ——————.

17. *අයදුම්කරුගේ අත්සන සහතික කිරීම* :

මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන ………………… මහතා/මහත්මිය/මෙනවිය මා පෞද්ගලිකව දන්නා බවද, ඔහු/ඇය මා ඉදිරිපිටදී 2008 …………… වැනි දින ඔහුගේ/ඇයගේ අත්සන තැබූ බව ද සහතික කරමි.

——————,
සහතික කරන අයගේ අත්සන.

සහතික කරන නිලධාරියාගේ නම : ——————,
තනතුර : ——————,
ලිපිනය : ——————,
දිනය : ——————,

18. අයදුම්කරු රජයේ සේවකයෙකු නම්, දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් මෙම කොටස සම්පූර්ණ කළ යුතුයි.

මෙම අයදුම්පත ඉදිරිපත් කරන ………… මහතා/මහත්මිය/මෙනවිය මෙම අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ/කාර්යාලයේ ………… ලෙස, ස්ථිර/තාවකාලික තනතුරක් දරන බවත්, ඔහු/ඇය සපයා ඇති තොරතුරු සත්‍ය හා නිවැරදි බවත්, සහතික කරමි. ඔහු/ඇය මෙම තනතුර සඳහා තෝරාගනු ලැබුවහොත්, මෙම දෙපාර්තමේන්තුවේ දැනට දරන තනතුරින් මුදා හැරිය හැකි/නොහැකි බවද මෙයින් දන්වා සිටිමි.

——————,
දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ ඔහු විසින්
බලය පැවරූ නිලධාරියාගේ අත්සන.

නම :——————.
පදවි නාමය : ——————.
(මුද්‍රාව තබන්න)

දිනය : ——————.

(අනවශ්‍ය වචන කපා හරින්න.)

*සැ. යු.* -: ඉල්ලුම්පත්‍රය සමඟ, මුදල් ගෙවා ලබා ගත් කුවිතාන්සිය/ලදුපත හැර වෙනත් කිසිදු ලියවිල්ලක් හෝ එහි පිටපතක් හෝ ඇමිණිය යුතු නැත.

07-641

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.